# තොටගමුවේ ශ්‍රී රාහුල මාහිමිපාණෝ

රියර් අද්මිරාල් (ආචාර්ය) සරත් වීරසේකර

# පටුන


හැඳින්වීම....................................................3

සතුරු සිංහල සේවියර් සෙන්පතිහු යුදපත් වතාවේ....................................................4

රාහුල හිමි දකුණු බාහුවේ කොටාගත් කවි දෙක....................................................8

කවුද මේ ශාන්ත සේවියර් පියතුමා?....................................................11

දේහය නරක් නොවන 'සිඳු අප් රස' මහිමය....................................................14

සාන්ත සේවියර් පියතුමාගේ දේහය තිබුණේ කොයිවිදියටද ?....................................................17

දේහයේ උස අඩුවීම ගැන කියන හේතු සාධාරණද?....................................................20

දේහයේ ඇට කටු දිරනවාද?....................................................23

පාප්තුමාටශ්‍රී ලංකාවෙන් අභියෝගයක්....................................................26

විස්මයජනක දේහයක් රටින් පිටකළේ කොහොමද?....................................................28

දිව්‍යමය සාක්ෂිවලින් හෙළිවන්නේ කුමක්ද?....................................................31

වානර රැලකට හසුවූ මල්දමක්....................................................34

නොදිරන මෘතදේහය ගැන ගල් පැලෙන බොරු....................................................36

එය එම්බාම් කරන ලද සිරුරකි....................................................39

සිරුර දේව බලයෙන් සුරක්ෂිත නැත....................................................41

මෙවැනි බොරු කීම දෙවියන්ට අගෞරවයකි....................................................44

## හැඳින්වීම

කෝට්ටේ රාජ්‍ය යුගයේ තොටගමුවේ සිරි රහල් සංඝරාජයන් විසින් ඉටුකළ අතිශය විශිෂ්ට සාහිත්‍ය සේවය ශ්‍රී ලාංකිකයන් කිසි කලෙකත් අමතක නොකරනු ඇත. විශිෂ්ට ගණයේ කවියෙක්වූ උන්වහන්සේ සැලලිහිණි සහ පරෙවි යන සංදේශ දෙකද, කාව්‍යශේඛරය නම් වූ මහා කාව්‍යයද ප්‍රබන්ධ කළහ. තවද උන්වහන්සේ විසින් රචිත ව්‍යරණ කෘතියක් වූ පඤ්චිකා ප්‍රදීපයද, බුද්ධප්පසාදිනියට ලියූ ටීකාවද රාහුල හිමිගේ විසල් බුද්ධිය මනාව පිළිබිඹු කරයි.

එසේම ත්‍රිපිටක වාගීශ්වර, සකල කලා සර්වඥ ෂඩ්භාෂා පරමේශ්වර යනාදී ගෞරව නාම ලද උන්වහන්සේ ආයුර්වේද විද්‍යාවේත්, නක්ෂත්‍රයේත්, අමනුෂ්‍යයන් පලවා හැරීමේ ඥානයෙනුත් හෙබි අතර දේව කතා, අද්භූත කථා යනාදිය ගැනද උසස් අවබෝධයක් තිබිණි.

හය වන පරාක්‍රමබාහු (15 වන සියවස) විසින් කුඩා කල හදා වඩා ගන්නා ලද රාහුල හිමි සෑම විටම රජුට කෘතවේදීව කල් ගෙවීය. සපුමල් කුමරු 6 වන පරාක්‍රමබාහු රජුගේ මුණුපුරාවූ ජයබාහු කුමරා මරා බුවනෙකබාහු නමින් රජවූ පසු රාහුල හිමි දකුණේ අම්බෙන නම් ලෙනෙහි හුදකලාව ජීවත් වූ බව ජනප්‍රවාදයේ දැක්වේ. දක්ෂ වෛද්‍යවරයකු වූ උන්වහන්සේ අපවත් වීමට මොහොතකට පෙර "සිදුහත් රසය" නම් ශක්ති සම්පන්න ඖෂධයක් පානය කළ බවද ඒ හේතුවෙන් එම මෘත දේහය දින දශලක්ෂයක් තබා ගැනීමට හැකි යැයිද විශ්වාස කරනු ලැබේ.

දැනට ඉන්දියාවේ ගෝවේ නුවර තබා ඇති ශාන්ත සේවියර් පියතුමාගේ මෘත ශරීරය එතුමාගේ නොව සිරි රහල් හිමිගේය යන්න සිංහල ජනයා අතර පවතින මතයයි. ජනප්‍රවාදයට අනුව පෘතුගීසීහු සොලොස්වන සියවසේදී රාහුල හිමිගේ දේහය ඉන්දියාවේ ගෝවේට ගෙන ගොස් ඇති අතර ඒ පිළිබඳව සූක්ෂම විග්‍රහයක යෙදෙන විට අනාවරණය වන්නේ රටේ එකල පැවැති දේශපාලන වාතාවරණයද එවැනි සිදුවීමකට හිතකරව පැවැති බවය. එම දේහය පිළිබඳව පැවැත්වූ පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාවෙන්ද එම දේහයේ අයිතිකරු පිළිබඳව යම් නිගමනයකට ඒමට උදව් කරයි.

රියර් අද්මිරාල් (ආචාර්ය) සරත් වීරසේකර විසින් රචිත තොටගමුවේ ශ්‍රී රාහුල මාහිමිපාණෝ යන පර්යේෂණ කෘතියේ අද ගෝවේ තිබෙන සාන්ත සේවියර්තුමාගේ යැයි කියන දේහය රහල් හිමිගේ දේහය බවට සනාථ කරන කරුණු හොඳින් දක්වා ඇත.

## සතුරු සිංහල සේවියර් සෙන්පතිහු යුදපත් වතාවේ



ශ්‍රී රාහුල හිමියන්ගේ ශ්‍රී දේහය

තොටගමුවේ ශ්‍රී රාහුල හිමි මෙතෙක් පහළ වූ අති විශිෂ්ට ගනයේ පඬිරුවනක් යැයි කිවහොත් එය අතිශයෝක්තියක් නොවේ. උන්වහන්සේ ත්‍රිපිටකයෙහි කෙළ පැමිණි බැවින් "ත්‍රිපිටක වාගීශ්වර" යැයිද සියලුම කලාවන්හි අගතැන්පත් වූ නිසා සකල කලා සව_ඥ යැයිද භාෂා සයක් මැනවින් දත් බැවින් "ෂඩ් භාෂා පරමේෂ්වර" යන ගෞරව නාමවලින් පිදුම් ලද්දෝ වූහ.

රාහුල හිමි කුඩා කල හදා වඩා ගනු ලැබුවේ සයවන පරාක්‍රමබාහු රජ විසිනි. පැවිදි වූ පසු රහල් හිමියෝ රජුගේ රාජාභිෂේකයෙන් 15 වන වසරේ පරෙවි සංදේශය ද, 34 වන වසරේ කාව්‍යශේඛරය ද, 35 වන වසරේ සැලළිහිණිය ද, 45 වන වසරේ පඤ්චිකා ප්‍රදීපය ද, රජුගේ අභාවයෙන් පසු බුද්ධිපසාදිනිය ද රචනා කරන ලදී. පඤ්චිකා ප්‍රදීපය, පාලි ව්‍යාකරණ පිළිබඳ ග්‍රන්ථයක් වන අතර එයින් රාහුල හිමිගේ මහත් වූ පරිණත සහ උදාර වූ බුද්ධිය පිළිබිඹු කරයි. එහි සඳහන් පෘථුල සාහිත්‍යය, සංස්කෘත සහ පාලි උපුටන සමුදාය සත්‍ය වශයෙන්ම විශ්මයජනකය. එහි අන්තර්ගතව ඇති අසූ දෙනකුට අධික දාර්ශනිකයන්ගේ උපුටා ගැනීම් සම්ප්‍රදායෙන්ම උසස්තම විශිෂ්ට කෘතීන් කොපමණ රාශියක් ඔහු විසින් හදාරා ඇත්දැයි සනාථ වෙයි.

රාහුල මාහිමි "වෙද හාමුදුරුවෝ" යනුවෙන්ද හඳුන්වා තිබිණ, පුරාවෘතයකට අනුව මාහිමි සතුව විවිධ රෝගාබාධ සඳහා වූ බලගතු තෙල් වර්ග තිබිණ. උන්වහන්සේගේ ඖෂධ පිළිබඳ ඥනය විශ්මයජනකය. සංස්කෘත භාෂාව පිළිබඳව තිබූ හසල දැනුම හේතුවෙන් භාරතීය වෛදික වෛද්‍ය ග්‍රන්ථ රාශියක් කියවා ලබාගත් ඥනය මෙරට අත්දැකීම් සමග මුසුවීමෙන් උන්වහන්සේ මෙරට පහළ වූ උසස්ම පන්තියේ වෛද්‍යවරයකු වූවාට නිසැකය. රහල් හිමි යම් යම් වතාවත් කරන ලද බවත්, ඉන්පසු විශ්මයජනක ලෙස රෝගීන් සුවපත්ව ඇවිද ගිය බවත් පවතින විශ්වාසයයි. එසේම උන්වන්සේ අපවත් වන්නට මොහොතකට පෙර "සිදු අලු රසය" නම් ශක්ති සම්පන්න ඖෂධයක් පානය කළ බවද, ඒ හේතුවෙන්ම මෘත දේහය නරක් නොවී දින දශ ලක්‍ෂයක් තබා ගැන්මට හැකි විය යන්නද විශ්වාස කරනු ලැබේ.

ක්‍රි. ව. 1505 දී පෘතුගීසිහු ලංකාවට පැමිණි අතර, අනතුරු වර්ෂයන් සිංහල සාහිත්‍යයට පමණක් නොව බුදු දහමට ද අතිශයින් අඳුරු කාල පරිච්ඡේදයක් විය. රටේ දේශපාලන තත්ත්වය අස්ථාවර වූ අතර, රජවරු තම තමන්ගේ බලය ලබාගැනීම සඳහා පෘතුගීසීන්ගේ උදව් පැතූහ. පෘතුගීසීන් අවස්ථාවෙන් ප්‍රයෝජනය ගත් අතර ධර්මපාල කුමරු කතෝලික ආගම වැළඳගත් දොන් ජුවන් ධර්මපාල නමින්



ශ්‍රී රාහුල හිමි වැඩ සිටි විහාරස්ථානය

කෝට්ටේ රජ විය. පෘතුගීසීන් විසින් තම පාලන කාලය තුළ ඉතා දුෂ්ට ලෙස බෞද්ධයෝ කතෝලික ආගමට හරවන ලදහ. රජතුමා අකාර්යක්ෂම සහ ජාතිය කෙරෙහි කිසිදු ඇල්මක් නොමැති වූ හෙයින් පෘතුගීසිහු සියලුම පන්සල් විනාශ කර කොල්ලකා, දහම්, සාහිත්‍ය වියරණ පොත පත ගිනිබත් කළහ. රහල්හිමිගේ ප්‍රතිභාව ගැන සලකා බලන කල්හි උන්වහන්සේ, දැනට ප්‍රකටව ඇති ග්‍රන්ථ 5 ට අමතරව, දර්ශනය, ව්‍යාකරණ, සිංහල සාහිත්‍ය යනාදිය සම්බන්ධයෙන් තවත් බොහෝ ග්‍රන්ථ රැසක් අනිවාර්යයෙන් ලියා ඇති බව නිසැක නමුත් ඒ සියල්ල ද දුෂ්ට පෘතුගීසීන් අතින් විනාශයට පත් වන්නට ඇති බැව් හැඟෙන විට ඇති වන්නේ මහත් සංවේගයකි.

එසේ නම් මෙසේ ලක්දිව ඉතා ප්‍රකට, ජනප්‍රිය පඬිවරයෙකුගේ දේහය, අපවත්වූ පසු ඉන්දියාවේ ගෝවේ නගරයට ගෙන ගියේ කෙසේද? එසේ ගෙන යාම සඳහා උන්වහන්සේ අපවත්වී වදාළේ කොහිද? දේහය පෘතුගීසීන් විසින් රැගෙන යනකල් සිංහලයෝ අත්වැල් බැඳගෙන උන්නාද? රජකෙනකුගේ සෙනෙහසින් හැදුනු වැඩුනු රජුගේ රැකවරණය ලැබූ පඬිරුවනකට මෙවන් අභාග්‍ය සම්පන්න ඉරණමක් අත්විය හැකිද? එසේම මෙවන් මහා අපරාධයක් කිරීමට, එනම් ශ්‍රී රහල් දේහය ගෝවේ නගරයට වැඩි කලබලයක් නොමැතිව ගෙන යාමට, සුදුසු දේශපාලන වාතාවරණයක් රටතුල තිබුණේද? මෙවන් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම දේහය පිළිබඳ නියම තතු දැනගැන්මට ඉහවල්වන බැවින් අප මඳක් ඒ පිළිබඳව ප්‍රථමයෙන් සොයා බලමු.

**රාහුල හිමි අවසාන කාලයේ සිටියේ කොහිද?**

සැළලිහිණි සංදේශයේ රාහුල හිමි විභීෂණ දෙවියන්ට කන්නලව්වක් කරයි. එනම් සයවන පරාක්‍රමබාහු රජුගේ දියණිය වූ උලකුඩය කුමාරියට (එනම් ලෝකනාථ කුමාරිට) පුතෙක් ලබාදෙන ලෙසයි. මෙම පුත් කුමරුවා එනම් ජයබාහු කුමරු රජුගේ අභාවයෙන් රජ වූවාට පසු සපුමල් කුමරු ඔහු මරා සයවන බුවනෙකබාහු නමින් රජවිය. සපුමල් කුමරු තුන්වරක්ම ජයබාහු ඝාතනය කිරීමට තැත්කළ අතර රාහුල හිමි ඒ ඝාතන කුමන්ත්‍රන තුනම වැළැක්වූ නමුත් සිව්වන වර උන්වහන්සේට ජයබාහු බේරා ගැනීමට නොහැකිවිය.

තමා හදාවඩා ගත් සයවන පරාක්‍රමබාහුගේ මුණුපුරාවූ ජයබාහුගේ ඝාතනයෙන් පසු මහත්සේ කලකිරීමට සහ ශෝකයට පත් රාහුල හිමි හුදකලා ජීවිතයක් ගත කරනු වස් විජයබා පිරිවෙන හැරදමා ගාලු දිස්ත්‍රික්කයේ ඇල්පිටියට නුදුරු "අම්බත" නම් ගුහාවක තම අවසාන කාලය ගෙවූ බව වාර්තා වේ.

එසේ හුදකලාව සිටීමට තීරණය කළේ සයවන බුවනෙක බාහුගෙන් උන්වහන්සේට ජීවිත තර්ජන තිබූ නිසාද විය හැක. කෙසේ නමුත් රාහුල හිමි අපවත්වීමට පෙර අම්බතහි විසූ ගල්ගුහාවෙහි එතුමාගේ දේහය තබා තිබූ ගල් ඇඳ රඳවා තිබූ ගල් කණු අද පවා දක්නට තිබේ.

රාහුල හිමි අවසාන කාලයේ හුදකලාව සිටි බවට සහ කිසිම රාජ්‍ය උත්සවයකට සහභාගි නොවූ බවට තවත් වැදගත් සාධකයක් බුරුමයේ සේගු නගරයේ ඇති කල්‍යාණ ශිලා ලිපි සාක්ෂි දරයි. සයවන බුවනෙකබාහු සමයේ (සපුමල්කුමරු) බුරුමයේ ධම්මෙච්තිය රජ විසින් මොග්ගල්ලාන නම් භික්ෂුව ඇතුළු භික්ෂූන් 22 නමක් ලංකාවට වැඩම වූ බවද ඔවුන් කැලණියේ කල්‍යාණි සීමාවේදී උපසම්පදාව ලබා නැවත බුරුමයට ගිය බවත් එහි සඳහන්වේ. ඒ සඳහා ලංකාවේදී සහභාගීවූ ප්‍රධාන භික්ෂූන් වහන්සේලා 4 නමකගේ, එනම් වීදාගම තෙරණුවෝ, ධම්මකිත්ති තෙරණුවෝ, වනරතන තෙරණුවෝ සහ සිහල රාජ මහාතෙරණුවෝ නම් සඳහන් වන අතර එකල විසූ සුප්‍රසිද්ධ තෙරනමක්වූ ශ්‍රී රාහුලගේ නම් සඳහන් නොවේ. නමුත් සයවන පරාක්‍රමබාහු කල පැවැත්වූ වැදගත් ආගමික උත්සවයන්හි ප්‍රධාන තැනක් ඉසිළුවේ රාහුල හිමිවන අතර පෙර කී කල්‍යාණි ශිලා ලිපියේම එය සඳහන් වෙයි. බුවනෙකබා රජ දවස රාජකීය අනුග්‍රහයක් ලත් උත්සවයකට රාහුල හිමි සහභාගී නොවීමෙන් පෙනෙනුයේ පරාක්‍රම රජුගේa මුණුපුරු ජයබාහුට කරන ලද අසාධාරණය නිසාම ඔවුන් අතර දැඩි විරසක බවක් තිබූ බවය. තවද රහල් හිමි සාමාන්‍ය ජනතාව ඇස නොගැටෙන හුදකලා ස්ථානයක ජීවත්වූ බවටද එය හොඳ සාක්ෂියකි.

එසේම පරම්පරා ගණනක් තිස්සේ මුවින් මුව ගලා ආ ජනකවි 2 කින්ද රාහුල හිමි හුදකලාව ජීවත්වූ බවක් උන්වහන්සේගේ දේහය පෘතුගීසීන් විසින් ගෝවේ නුවරට ගෙනගිය බවත් තවදුරටත් සනාථ වේ.

සොඳුරු රාහුල අපත්වී සක දහස සිව් සක තෙලෙස් වේ
ඉසුරු නරනිඳු සවැනි බුවනෙකබාහු සපුමල් රෝස වේ
සතුරු කම් කළ නිසා තෙරිඳුට වැඩිය ගල්ලෙන දිසා වේ
ඇදුරුගේ දෙන ලෙනින් ගත් දින දනෝ යුද කළෙ ඒ නිසා වේ

ආදරණීය රහල් හිමි අපවත් වූයේ ශක වර්ෂ 1413, එනම් ක්‍රි.ව.1413 + 78 - 1491 දීය. සවැනි බුවනෙකබාහු තෙරිඳුට සතුරුකම් කළනිසා හිමි ගල්ලෙනට වැඩියහ. උන්වහන්සේගේ දේහය ගල්ලෙනින් පිටතට ගත් දින ජනතාව එයට විරුද්ධව යුද්ධ කළෝය.

සතුරු සිංහල සේවියර් සෙන්පතිහු යුද පත් වතාවේ
ඉඳුරු ගල්ලෙනෙහි යක් සෙන් ඇසුරු කර සිටියෙහි මනාවේ
මිතුරු ජපකළ දහසකට කල් පවතිනා තුරු කරපු ජීවේ
මහරු රාහුල තෙරිඳුගේ මළ සිරුර ගෙන ගොස් තැබුවෙ "ගෝවේ"


සෙන්පති සේවියර් සිංහලයාට සතුරුව යුද වැද සිටියහ. රහල් හිමිගේ දේහය මන්ත්‍ර ජපකොට යක්ෂයන් විසින් ආරක්ෂා කරමින් සිටියහ. දහසක් කල් තබා ගැනීමට ජීවම් කර තිබූ රහල් හිමිගේ මළ සිරුර උන් ගෝවේ නගරයට රැගෙන ගොස් තැබූහ.

ජනප්‍රවාද අපට අවඥවෙන් බැහැර කළ නොහැක. ජනප්‍රවාදයෙන් සහ ඉහත සාක්ෂි වලින් පෙන්වනුයේ රාහුල හිමි අවසන් කාලය ගෙවූයේ ඉතා හුදකලාව බවය. එසේම එක් කවියකින් කියැවෙන්නේ එම දේහය ගෝවේට ගෙනගිය බවය.

## රාහුල හිමි දකුණු බාහුවේ කොටාගත් කවි දෙක

රාහුල හිමි තම අවසන් කල "අළුබන" හි විසූ බව සනාථ කිරීම, දේහය ගෝවේවලට ගෙන ගියාය යන අපගේ තර්කය ගොඩනැගීම සඳහා උපකාරී වේ. එදා දොඩන්දූව වරාය පිහිටා තිබුණේ ඊට නුදුරිනි. දොඩම්දූව ජනතාව රුවල් නෞකා නිෂ්පාදනයේ අති දක්ෂ වූවෝය. 15 වන සියවසෙහි දොඩම්දූව ඉන්දීය යාත්‍රා සඳහා ප්‍රසිද්ධ තොටුපළක් වූ බවද පුරා විද්‍යාත්මකව සනාථ වී ඇති කරුණකි.

රාහුල හිමි අපවත් වූයේ අම්බන ඉදුරුලෙන්ගිරි ගල්ගුහාවක් තුළය. අදටත් සඳ නැති රැයක අම්බන ගුහාව දෙසින් අමුතු ශබ්ද සහ ගල්දොරක් විවෘත වන ශබ්ද ඇසෙන බවත් අමාවක දිනවල ඒ පෙදෙසින් "දේවතා එලි දෙයියන්නේ වෙල" දෙසට ගමන් කරන බවත් ප්‍රදේශයේ ජනතාව කියති. (දෙයියන්ගේ වෙල යනු රහල් හිමියනට සහල් සැපයූ වෙලයි).



මෙම ප්‍රදේශයේ ගම්මානවල නාමයන් රාහුල හිමි සම්බන්ධ කටයුතුවල ප්‍රතිඵලයක් ලෙස සැදුණු බැව් ජනතාව විශ්වාස කරති. රාහුල හිමි සත්‍ය වශයෙන්ම 6 වන බුවනෙක බාහු සමග විරසක වී මෙම ප්‍රදේශයේ සිටි බැව් සනාථ කිරීමටද මෙය කදිම සාක්ෂියක් වී ඇත.

(අ) අම්බන - පෘතුගීසීන්ට රහල් හිමිගේ දේහය පෙන්වීමට ඔවුන්ව රැගෙන ගිය සිංහල මිනිහා ඈත සිට එම ගල්ගුහාව පෙන්වා "ආන් බෙන" යැයි කීවාලු. ඉන්පසු එම පෙදෙස "ආන්බෙණ" - අම්බෙන වී පසුව "අම්බන" විය.

(ආ) සිල්වත්ගොඩ - රහල් හිමිට සිවුපසෙන් සංග්‍රහ කරමින් (සිවුරු, පාත්‍ර, ඇඳ, ආහාර) ජීවත්වූ සිල්වත් මිනිසුන් ජීවත් වූ පෙදෙස "සිල්වත්ගොඩ" නම් විය.

(ඇ) ගනේගොඩ - ගන - භික්ෂූන්, ගනේගොඩ යනු භික්ෂූන් වහන්සේලා ජීවත් වූ ස්ථානයයි.

(ඈ) මහරක්කන්ද- මහරක්කන්ද යනු අම්බන කන්දට යන මාර්ගය ආරක්ෂා කළ මිනිසුන් ජීවත්වූ ගමයි. මග මාර්ගය, 6 ක් රක්ෂා කළ කන්ද, මගරක්කන්ද, මහරක්කන්ද විය.

(ඉ) මලපලවත්ත - රාහුල තෙරණුට මල් සහ පලතුරු සැපයූ ගම මලපල වත්ත විය.

(ඊ) මහම්මගෙදූව - රහල්හිමිට උපස්ථාන කළ මහම්මා නමැති උපාසිකාව විසූ, කුඹුරුවලින් වටවූ පෙදෙස මහම්මගෙ දූව විය.

(උ) ඇවිලුම - රහල් හිමිගේ දේහය පෘතුගීසීන් විසින් රැගෙන යැමට උත්සාහ කළ අවස්ථාවේ එක්තරා ස්ථානයක ගම්මුන් විසින් එය වැළැක්වීමට පෘතුගීසීන් හා සටන් කරන ලදී. එම සටන ඇවිලුණු ස්ථානය "ඇවිලුම" නම් විය.

(ඌ) රෑකඩහේන - පෘතුගීසීන් හම්බනට පැමිණෙන විට රැයක් ගත කළ ස්ථානය රෑ - රාත්‍රිය, කඩ - කඩ කළ ගත කළ, හේනවත්ත ස්ථානය රෑකඩවත්ත විය.

(එ) යක් බටේ - රහල්හිමි දේහය ආරක්ෂා කළ යක්ෂයන් පලවා හැරිය ස්ථානය එනම් යක්ෂයන්ට බැටේ දුන් ස්ථානය යක්බටේ විය.

අදටත් එම පෙදෙසෙහි ඇබිත්ත ගොඩැල්ල යන වාසගම ඇති මිනිසුන් ඉතාම ආඩම්බරයෙන් තමන් රහල් හිමිට උපකාර කළ අයගෙන් පැවතෙන්නන් යැයි කියති.

රාහුල හිමි තම අවසාන මොහොතේ දේහය නරක් නොවී තබා ගැනීම සඳහා "සිදුඅළු රසය" නම් වූ බලවත් ඖෂධයක් වැළඳූ බව අප සඳහන් කළෙමු. උන්වහන්සේ අපවත්වූ ගල්ලෙන තුළ හෝ ඒ අසළ එම ඖෂධයේ ඉතිරි කොටස, විවිධ වර්ගයේ වටිනා වස්තූන්, වැදගත් ග්‍රන්ථ, යන්ත්‍ර මන්ත්‍ර යනාදිය තවමත් සැඟවී තිබේය යන්න ගම්මු විශ්වාස කරති. එසේම වැඩ කටයුතු කිරීමට යොදවා ගත් යක්ෂයන්ම තම දේහය අඩංගු ගුහාව ආරක්ෂා කිරීමටද යොදවා තිබූ බවට ද විශ්වාස කෙරේ.

ජනප්‍රවාදයට අනුව තමා අවසන් හුස්ම හෙලන අවස්ථාවේ උන්වහන්සේම තම පෙට්ටියෙහි සැතපී තමා අපවත්වූ විගස පියන්පත වසා දමන මෙන් යක්ෂ සේවකයන්ට අණකර ඇත. රාහුල හිමි සියලුම ආරක්ෂක විධිවිධාන යොදවා රහසිගතව තම මළ සිරුර නිරුපද්‍රිතවම තබා ගැනීමට බෙහෙවින්ම උත්සුක වූයේ තමාට ඉතා සතුරු බුවනෙකබාහු රජු තමා මිය ගිය ද තම සිරුරට හෝ නිග්‍රහ වන අන්දමේ යම් දෙයක් කරතැයි යන සැකය නිසා විය හැක.
රාහුල හිමිගේ උපක්‍රමය සාර්ථක වූවා යැයි කිවහැක්කේ බුවනෙකබාහු රජුට රහල් හිමි ගැන හෝ උන්වහන්සේගේ දේහය ගැන හෝ කිසිම තොරතුරක් දැනගැනීමට නොහැකි වූ හෙයිනි. රහල් හිමිගේ දේහය ගලෙන් නිම කරන ලද ඇඳක තබා යාත්‍රාවක් වැනි) එය ගල්කනු 4 ක් මත තබන ලදී. (මෙම ගල්කණු 4 අදටත් අම්බන ගුහාවේ දක්නට ඇත.)

පෘතුගීසීන් දකුණු වෙරළබඩ තීරය තම අණසකට යටත් කරමින් සිටිනවිට මෙම "නරක් නොවී" තිබෙන දේහය ගැන ආරංචි වී එය ගැනීමට ආ කල දේහය ආරක්ෂා කිරීමට සිටි යක්ෂයන්ගෙන් බොහෝ බාධා ඇති විය. එසේම ජනප්‍රවාදයේ ම පැවසෙන පරිදි රාහුල හිමි අම්බන සිටින විට උන්වහන්සේගේ ආවතේවකම් කළ පුංචිත්තා නමැත්තා යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම් රාහුල හිමිගෙන් උගත්



රාහුල හිමියන්ගේ දේහය තැන්පත්කර ඇති ගෝවේ වේල්හා බැසිලිකාව

අතර අවසානයේ පෘතුගීසීන් පුංචිත්තාගේ උදව් ඇතිව මන්ත්‍ර බලයෙන් යක්ෂයන් පලවා හැර දේහය ගැනීමට සමත්වූ බැව් ද කියැවේ.

රාහුල හිමි තම දකුණු අතෙහි පහත සඳහන් කවි දෙක කොටා තිබූ බව විශ්වාස කෙරේ.

සවර ලද මුල් කඳ
සිඳු අළු රස වැළඳු නේද
දහසක් දිනා ලද
රහල් හිමි නැඟු මෙදිය දිය දද

(රහල් හිමි වන මා වර සයක් ලද අතර මුල් වරය ස්කන්ධ දෙවියන්ගෙනි. සිඳු අළු රසය වළඳා දින දහසක් දිනා මෙලොව ජයග්‍රාහී ධජය එසවීමි).

නිරිඳු බුවනෙක බා
බලය තෙවිටක් පසුබා
රුපු යුදයට නොබා
මමය පැරකුම් රජුගෙ ගජබා

(බුවනෙකබා රජුගෙ බලය තුන්වරක් පරාජයකොට ඔහු හා යුදයට නිබයව ඉදිරියට ගිය පැරකුම් රජුගේ ශක්තිමත් හස්තය මම වෙමි.)

රහල් හිමි මෙම කවි දෙක තම දකුණු බාහුවේ කොටා ඇත්තේ තමා හුදකලාව සිටි බැවින් කවදා හෝ පසුව තමාව හඳුනා ගැනීමට විය යුතුය. අද ශාන්ත සේවියර්ගේ යැයි ගෝවේ තබා තිබෙන දේහයේ දකුණු අත අතුරුදන්වී ඇතැයි යන පුවත ඇසුවොත් ඔබට කුමක් සිතේද?

## කවුද මේ ශාන්ත සේවියර් පියතුමා?



රාහුල හිමියන්ගේ දේහය තැන්පත්කර ඇති ගෝවේ වේල්හා බැසිලිකාව

වර්තමානයේ ඉන්දියාවේ ගෝවේහි "ජේසු ජන්ම බැසිලිකා" නම් පල්ලියෙහි 16 වැනි ශතවර්ෂයේ විසූ ශාන්ත සේවියර්පියතුමාගේ දේහය යැයි විශ්වාස කරන දේහයක් තිබේ. තිබෙන වාර්තාවලට අනුව මෙම දේහය මිය ගිය පසු කිසිම දිනෙක "එම්බාම්" කර නොමැති අතර බොහෝ කලක් ඉතා හොඳ තත්ත්වයේ තිබී දැන් කෙමෙන් කෙමෙන් දිරාපත් වන තත්ත්වයට පත්වෙමින් තිබේ. සිංහලයන් විශ්වාස කරනුයේ මෙම දේහය අන් කිසිවකුගේ නොව ශ්‍රී රාහුල හිමිගේ දේහයම බවයි. රාහුල හිමි සම්බන්ධයෙන් අප සැකෙවින් විස්තර කර ඇති නිසා ශාන්ත සේවියර් යනු කවුරුන්දැයි අපි කෙටියෙන් සොයා බලමු.

වර්ෂ 1506 අප්‍රේල් මස 7 වැනි දින ස්පාඤ්ඤයේ නවාරාහි වෛද්‍ය ජෝආඩි සේවියර්ට සහ මේරියාඩි ඇස්පිල්කිමාට දාව සේවියර් මාළිගයේදී පවුලේ අවසාන සහ අන්තිම දරුවා ලෙස පිරිමි දරුවෙක් උපත ලද අතර ඔහුගේ නම ෆ්‍රැන්සිස් නම් විය. වර්ෂ 1512 දී ස්පාඤ්ඤය නවාරා ආක්‍රමණය කොට තම ප්‍රාන්තයක් බවට පත් කරගත් අතර ෆ්‍රැන්සිස්ගේ පියා ඊට මාස 4 කට පසුව මිය ගියේය. 1525 දී 18 හැවිරිදි ෆ්‍රැන්සිස් පැරිස් විශ්වවිද්‍යාලයේ ඉගෙනුම ලැබීම සඳහා ප්‍රංශය බලා පිටත් විය.

විශ්වවිද්‍යාලයේදී ෆ්‍රැන්සිස් ඉනීගෝ ලොයොලා නම් වූ කතෝලික මිත්‍රයා සමග එකම කාමරයේ කල් ගෙවූ අතර ඉනිගෝ ක්‍රම ක්‍රමයෙන් ෆ්‍රැන්සිස්ට ජේසුතුමාගේ සුප්‍රසිද්ධ කියමන් දේශනා කරමින් ඔහුව කතෝලික ආගමට හරවන ලදී. කතෝලිකයෙක් බවට පත්වූ ෆ්‍රැන්සිස් දුප්පතුන්ට උපකාරී වීම සඳහා තම දිවිය කැප කිරීමට තීරණය කළේය.

1537 දී ෆ්‍රැන්සිස් සහ ඉනීගෝ තම මිත්‍රයන් සමග ආශිර්වාද ලබා ගැනීම සඳහා රෝමයේ පාප්වහන්සේ හමුවීමට ගිය අතර එහිදී ඔවුන් සියලුදෙනාම කතෝලික පූජකයන් බවට පත් කෙරිණ. ඉන්පසු ඔවුන් ජේසු නාමය යටතේ සමිතියක් පිහිටුවාගෙන නගරයේ රෝගීනට උපකාර වීමට පටන් ගති.

පාප් වහන්සේ විසින්, පෘතුගාලයේ රජුගේ ඉල්ලීම පරිදි ඈත ඉන්දියාවට ආගමික/ සුබසාධක කටයුතු සඳහා පූජකවරයෙක් නම් කළ නමුත් ඔහු දැඩි සේ රෝගාතුර වූ නිසා ඒ වෙනුවට ෆ්‍රැන්සිස් පූජකවරයාව නම් කරන ලදී. ෆ්‍රැන්සිස් පියතුමා 1542 දී දීර්ඝ සහ අසීරු ගමනකින් පසු ඉන්දියාවට පත් කළ නව පෘතුගාල ආණ්ඩුකාරවරයා වූ මාටිම් අපොන්සෝ සමග ඉන්දියාවේ ගෝවේ නුවරට සැපත්

විය. මේ වනවිට පාප් වහන්සේ විසින් ෆ්‍රැන්සිස් සේවියර් පූජකතුමා ඈත පෙරදිග තමාගේ නියෝජිතයා ලෙස පත් කර තිබිණ.

ගෝවේ නුවරදී බිෂොප්තුමා හමුවූ ෆ්‍රැන්සිස් ඔහුගේද උපදෙස් සහ සහාය මත එම නුවර දුප්පතුන්ට සහ රෝගීන්ට උවටැන්/උපකාර කිරීම ආරම්භ කළ අතර ඒ අතරතුර පෘතුගීසීන්ගේ ගෝවේ නුවරට ආසන්න ඉතාම වැදගත් නගරයක් වූ, කොචින් නගරයටද යන ලදී.



ඉන්පසු ඔහු මලක්කාවටද, කොමරින් තුඩුවටද, ජපානයට ද, ගෝවේ සිට වරින්වර ගොස් ජේසුතුමාගේ පණිවුඩය ප්‍රචාරය කළ අතර ඔහුගේ නිතර ගමන් හේතුවෙන් ම ඔහුට "සංචාරක පූජකතුමා" යන නාමයද පටබැඳින. ජපානයේ සිට ගෝවේ නුවරට යළි පැමිණි ෆ්‍රැන්සිස්, ගාගො පියතුමා, අල්වාරෝ ෆෙරෙයිරා පූජකතුමා, චීන ජාතික සැන්ටා ෂෙ සහ ඉන්දියානු සේවක ක්‍රිස්ටෝවා සමග චීනය බලා යැමට පිටත් විය. චීනයට යන අතරතුරේ ඔවුන් "සැන්ක්ෂන්" යන දූපතට ළඟා විය.

වසර ගණනාවක් තිස්සේ ඉතාම දුෂ්කර ගමන්වල යෙදී ආගමික ප්‍රචාරක කටයුතුවල සහ සමාජ සුබසාධන කටයුතුවල දිවා රෑ නොබලා ක්‍රියා කරමින් සිටි ප්‍රැන්සිස් "සැන්ක්ෂන්" දූපතේදී තද බල ලෙස රෝගාතුර විය. ඉන්පසු ඔහු එම දූපතේදීම 1552 දෙසැම්බර් 3 වන දින මිය යන ලදී. මිය යනවිට මහලු පෙනුමෙන් යුක්ත වුවද ඔහුගේ වයස අවුරුදු 46 ක් විය.

"කැතලික් මැසෙන්ජර්" නම් පුවත්පතෙහි (1931 දෙසැම්බර් 1 වැනිදා) එම දේහයට ඉන්පසුව වූ දේ පිළිබඳව පහත දක්වා ඇති අයුරින් විස්තර කර ඇති අතර එය ලබා ඇත්තේ වීරවිපොලෙහි කැස්ටස් පූජකතුමා විසින් සම්පාදනය කරන ලද "කෘත්‍රිම එම්බාම් කරණයෙන් තොරව මළ සිරුර නරක් නොවී සකස් කිරීම" යන කෘතිය ආශ්‍රයෙනි.

අ. ෆ්‍රැන්සිස් පූජකතුමා මිය ගිය පසු චීන ජාතික සැන්ටා ෂෙ විසින් චීන චාරිත්‍රයට අනුව, දේහය රළු මිනී පෙට්ටියක බහා එහි විශාල ප්‍රමාණයක් හුනු දමා කුඩා කන්දක් යට වළලනු ලැබීය. (හුණු දමන්නේ සිරුර නරක්වීමේ ක්‍රියාවලිය වේගවත් කිරීමටය)

ආ. මාස දෙකහමාරකට පසු එනම් 1553 පෙබරවාරි 13 වන දින සැක්ස්ෂන් සිට මලක්කාවට නෞකා යාත්‍රා කිරීමේ කාලය පැමිණ ඇති බැවින් පියතුමාගේ ඇටකටු ඉන්දියාවට යැවීමට සැලසුම් කොට මිනිය ගොඩගන්නා ලදි.

ඈ. මිනී පෙට්ටිය විවෘත කර හුණු ඉවත් කළවිට අපේක්ෂා කළ පරිදි ඇටකටු සහිත ඇටසැකිල්ලක් දක්නට නොතිබුණු අතර සිරුර එදා මියගිය කෙනකුගේ මෙන් ඉතා හොඳ තත්ත්වයෙන් තිබිණ. එසේම ඉන් මිහිරි සුවඳක්ද වහනය වන්නට පටන් ගෙන තිබිණ. මෙයින් පුදුමයට පත් පිරිස සිරුර පරීක්ෂා කිරීම සඳහා කකුලේ කලවයට කුඩා තුවාලයක් කළ විට ඉන් පිරිසිදු ලේ වහනය වීමට පටන් ගති. පුදුමයට පත් වූ ඔවුහු ඉන්පසු සිරුර යළි පෙට්ටියට දමා නැවතත් හුණුවලින් ආවරණය කර ඒ වනවිට වරායට පැමිණ සිටි "සැන්ටක්‍රෝසෙ" නම් වූ නෞකාවට පටවන ලදී.

ඇ. මෙම නෞකාව ඉන්පසු 1553 මාර්තු 27 වනදින මලක්කාවට සේන්දු විය. ඉතා අලංකාර උත්සවයකින් නෞකාවේ සිට එම මිනී පෙට්ටිය මලක්කාවේ "අවර් ලේඩි ඩි මොන්ටෝ" යන පල්ලියට ගෙන යන ලදී. මිනී පෙට්ටිය විවෘත කළවිට පෙරසේම දේහය ඉතා හොඳින් (ඇඳුම් පැළඳුම් ද සහිතව) තිබෙන බැව් නිරීක්ෂණය කරන ලදී. ඉන්පසු නැවත වරක් පල්ලිය භූමියේ භූමදාන කරන ලදී.

දේහය මෙවර භූමදාන කළ අයුරු විස්තර කර ඇත්තේ මෙසේය. දේහය ඉවතට ගෙන ඝන රෙද්දකින් ඔතා, තෙත බරිත වූ පසෙහි, මිනී පෙට්ටියක් ද නොමැතිව, හිසට කුඩා මෙට්ටයක් තබා, මුහුණ කුඩා රෙදි කැබැල්ලකින් ආවරණය කර බහාලන ලදී. මිනීවළ දේහයට වඩා ටිකක් කුඩා වූ බැවින් එයබලෙන් ඇතුලට ඔබා පස් දමා තද කරන ලදී. මේ අවස්ථාවේදී සිරුරෙහි බෙල්ල කැඩී තුවාලයක් සිදුවී රුධිරය පිටවූ අතර ඉන් මිහිරි සුවඳක් ද වහනය වන්නට පටන් ගති.

ඉ. එම වසරේම අගෝස්තු මස සේවියර් පියතුමාගේ හොඳ මිතුරෙකු වූ ජෝන් ඩි බර්ස් නමැති පියතුමා මලක්කාවට පැමිණ දේහයට ගෞරවනීය භූමදානයක් දෙනු පිණිස එය යළි ගොඩ ගන්නා ලදී, එතරම් අගෞරව ලෙස කිසිදු ආරක්ෂාවකින් තොරව තෙත බරිත පස්ගොඩක මාස 5 ක පමණ කාලයක් තිබූ සිරුර කිසිසේත්ම නරක් නොවී තිබුණු බැව් ඔහු නිරීක්ෂණය කර ඇත. එසේම ඔහු පහත සඳහන් ලෙස සිරුරෙහි තුවාල ද සටහන් කරන ලදී.

"පස් දමා තද කරනවිට තියුණු ගලක කොනක් වැදීම නිසා මුහුනේ වම් පැත්තේ ගැඹුරු තුවාලයක් ඇතිවී ඇති අතර නාසය තැලී හීරී ඇත. මුහුණ ආවරණය කළ රෙදි කැබැල්ල සහ හිසට තැබූ කුඩා මෙට්ටය ලෙයින් නැහැවී තිබේ. ශරීරය ඇතුළේ සිදුවී ඇති තුවාලය නිසා රුධිරය මුවින් පිටවී ඇත." යනුවෙනි.

ඉහත සඳහන් පුවත්පතෙහි සහ පොතෙහි දේහය පිළිබඳ කරුණු දක්වා ඇත්තේ එසේය. දේහය ඉන්පසු ගෝවේවලට ගෙන යැම පිළිබඳවත් ඉන්පසුව එයට සැලකූ ආකාරයත් (එම පොත්පත් ඇසුරින්) මතුවට සඳහන් කරනු ලැබේ. රාහුල හිමිගේ දේහය පෘතුගීසීන් විසින් දොඩන්දූව වරායට ගෙන යැමට තැත් කිරීමේදී ගම්වාසීන් (සිංහලයන්) එය වැළැක්වීමට සටන් කරන විට දේහයට තුවාල සිදු විය හැකි බව උපකල්පනය කළ හැක. (දේහයේ තුවාල / කැපුම් තිබෙන බැවින්) නමුත් ආශ්චර්යයක් ලෙස නරක් නොවී තිබුණ, පූජකතුමකුගේ දේහයක් ඉතා උත්සවාකාරයෙන් මලක්කාවේ වරායේ සිට පල්ලියට රැගෙන ගොස් සාමානය මිනිසකුගේ සිරුරකට සලකනවාටත් වඩා

ඉතා කෘෂර ලෙස (ඉහත සඳහන් කර ඇතිවාක් මෙන්) සලකයිද? එසේ නැත්නම් එය දේහයේ තිබෙන කැපුම් කෙටුම් "සාධාරනීය" කිරීම සඳහා නිර්මාණය කොට ගෙතූ කතාවක් ද? නැතිනම් සාන්තුවරයකුගේ "පින්වත්" දේහයක මෙතරම් තුවාල තිබෙන්නේ කෙසේද?

## දේහය නරක් නොවන 'සිඳු අළු රස' මහිමය

ශාන්ත සේවියර්තුමා පිළිබඳ කිතුනුවන් ලියා ඇති පොතපත අනුව මෙම සිරුර ඉන්පසු ලෝපෝ ඩි නොරොඤ්ඤො නම් වූ කපිතාන්වරයාගේ නෞකාවෙන් ඉන්දියාවේ ගෝවේ නුවරට ගෙන යන ලදී. මේ සඳහා සේවියරගේ ධනවත් මිතුරෙකු වූ වියාගෝ පෙරේරා නම් වූ මහතෙක් උදව් විය. 1553 සැප්තැම්බර් මස මලක්කාවෙන් පිටවූ යාත්‍රාව 1554 මාර්තු 15 වැනි දින ගෝවේට ළඟා වී ඇත. මෙහිදී දේහය රාජකීය ගෞරවයෙන් පිළිගෙන ගරු කටයුතු අලංකාර ඇඳුම් අන්දවා උත්සවශ්‍රීයෙන් ශාන්තපෝල් ඉපැරැණි පල්ලිය වෙත ගෙන යන ලදී. එහි දින තුනක් බැතිමතුන්ගේ ගෞරවය දක්වනු පිණිස තබන ලදී.

ඉන්පසු තුන් වැනි වරට සිරුර බලලා ඇත්තේ ශාන්ත පව්ලෝ නම් වූ පල්ලිය අසලය. මෙම පල්ලිය 1560 වසරෙහිදී කඩා දැමූ අතර දේහය නැවත ගොඩගෙන වෙනත් පල්ලියක් වෙතට ගෙන ගොස් මහජන ගෞරවය සඳහා විවෘත කර තබන ලදී. මෙහිදී ඉතා උසස් කුල කාන්තාවක් වූ රජකීය දොන ඉසබෙලා ඩි කැරොන් නම් පෘතුගීසි කාන්තාව දේහයේ දකුණු පාදය සිඹින මුවාවෙන් පාදයේ කුඩා ඇඟිල්ල මුවින් හපා වෙන් කොට ඇත. එවිට රුධිරය ගලා ඒමට පටන් ගති. මෙම දේහය පිළිබඳව ඉන්පසු කාලීනව කරුණු දක්වා ඇත්තේ මෙසේය.

(අ) රෝමයේ වෙසෙන ජොෂ්ඨ පියතුමෙකු වූ ක්ලෝඩියෝ ඇක්වවිවෝ මෙම දේහය පිළිබඳ විමසූ අවස්ථාවේ ගෝවේ ප්‍රාදේශීය බලවතා වූ ෆැන්සිස්කෝ වියරා දේහය නරක් නොවී තිබෙන බැව් සනාථ කිරීමට සිරුරේ කොටසක් යැවීමට තීරණය කරන ලදී. ඒ අනුව වර්ෂ 1614 නොවැ. 3 වැනි දින මධ්‍යම රාත්‍රියේදී පූජකවරුන්ගේ අධීක්ෂණය මත සිරුරේ දකුණු අතෙහි වැලම්ටෙන් පහළ කොටස කපා රෝමයට යවන ලදී.

(ආ) ඉන්පසු වර්ෂ 1619 අප්‍රේල් මස 17 වැනි දින දකුණු අතෙහි ඉතිරි කොටස මුළුමණින් කපා එය කොටස් 3 කට බෙදා මලක්කා කොඩිය සහ මකාවෝ යන ස්ථානයන්හි ජේසු අධ්‍යයන පීඨක් වෙත යවන ලදී. (රාහුල හිමිගේ දකුණු බාහුවෙහි මරණින් පසු හඳුනා ගැනීම උදෙසා සවර ලද මුල් කඳ සහ සතුරු බුවනෙකබා යන කවි දෙක කොටා තිබූ බවත් එනිසාම පෘතුගීසීන් විසින් දේහය ගෙනගිය පසුව දකුණු අත කපා ඉවත් කොට ඇති බවත් සිංහලයන් විසින් විශ්වාස කරන බැව් නැවත මතක්කර දෙමි)

(ඇ) වර්ෂ 1620 දී සිරුරේ අභ්‍යන්තර අවයව සහ බඩවැල් සියල්ල එළියට ගෙන කොටස් කර ජපානය ඇතුළු ලොවෙහි සියලුම රටවල්වලට බෙදාහරින ලදී.

(ඈ) වර්ෂ 1630 දී මිනී පෙට්ටිය නැවත විවෘත කර පෘතුගාලයේ ලිස්බන් නුවර සිට පැමිණි ට්‍රැන්කියුලෝ ග්‍රාසටි නම් පියතුමාට දැකීමට ඉඩ සලසන ලදී, ඉන්පසු මහජන ගෞරවය සඳහා ද විවෘත කර තබන ලදී. මෙකල ආගමික කෙනකු වස්තූන් එකතු කිරීමේ දැඩි ආශාවක් ජනතාව තුළ තිබී ඇත. ඒ තම ආත්මය සහ දිව්‍යලෝකය අතර සම්බන්ධයක් ඇති කර ගැනීමටය. එබැවින් මෙම දේහය නැරඹීමට විවෘත කළ සෑම අවස්ථාවකදීම සිරුරෙන් හෝ ඇඳුමින් කුඩා කොටස් කඩා ගැනීමට යුහුසුළු වී ඇත.

(ඉ) සිරුර ක්‍රම ක්‍රමයෙන් වේලී යන තත්ත්වයක් තිබෙන බැවින් මින් මතු විවෘත නොකිරීමට තීරණය කර ඇත. ගෝවේහි තබා ඇති ශාන්ත සේවියර් පියතුමාගේ යැයි කියනු ලබන දේහය පිළිබඳව කිතුනුවන් කරුණු දක්වා ඇත්තේ ඉහත සඳහන් පරිදිය.

එසේම මෙම දේහය පිළිබඳව වර්ෂ 1556 සිට වරින් වර පශ්චාත් මරණ පරීක්ෂණ වෛද්‍යවරුන් විසින් කර ඇති අතර ඒ සම්බන්ධ වාර්තාවක් කියැවීමේදී සිරුරේ තත්ත්වය පිළිබඳව සත්‍ය තත්ත්වය අවබෝධ කර ගත හැක.

දේහය පිළිබඳ වෛද්‍ය සරාවියෝ සහ වෛද්‍ය රිබේරියෝගේ මරණ පරීක්ෂණ වාර්තාව

වර්ෂ 1558 නොවැම්බර් මස වෛද්‍ය සරාවියෝ සහ වෛද්‍ය රිබේරියෝ විසින් දේහය පරීක්ෂා කොට ඇති අතර දිවුරුම් මත ඉදිරිපත් කර ඇති වාර්තාවන් මෙසේය.

'වයිස් රෝයි සාමිවරයාගේ නිල වෛද්‍යවරයා වන වෛද්‍ය කොස්මස් සරාවියෝ වන මා විසින් ෆ්‍රැන්සිස් පියතුමන්ගේ (ශාන්ත ෆ්‍රැන්සිස් පියතුමා යැයි සඳහන් කොට නොමැත්තේ ඔහු ඒ වන විට ශාන්තුවරයෙක් ලෙස පත් කර නොමැති නිසාය) දේහය ගෝවේ නගරයේදී පරීක්ෂා කර බැලීමි. සිරුරේ සෑම කොටසක්ම පරීක්ෂා කොට බැලූ අතර උදරය ඔබා බැලීමේදී අතුනුබහන් (මඩවැල්) ඉතා හොඳ තත්ත්වයේ තිබෙන බැව් අවබෝධ කර ගතිමි. සිරුර එම්බාම් නොකොට නරක් නොවීමට කෘතිම ලෙස ශරීරයට කිසිවක් ඇතුළු නොකොට මෙම තත්ත්වය පවතී.

"මා සිරුරේ වම් පැත්තේ හදවත පෙදෙසෙහි සිදුරක් හෝ තුවාලයක් වැනි දෙයක් දැක ජේසුස්වහන්සේගේ ගිහි සහෝදරයන් දෙදෙනකුට ඔවුන්ගේ ඇඟිලි ඒ තුළට දමන ලෙස කියූ අතර එසේ ඇඟිලි දැමූ පසු එකෙනෙහිම පිරිසිදු රුධිරය ගලා ඒමට පටන් ගති. මා ඒ රුධිරය ආඝ්‍රාණය කළ නමුත් එහි කිසිදු දුගඳක් නොවී. පාද සහ සිරුරේ අනික් කොටස් මාංශ ඇතුළුව ඉතා හොඳ තත්ත්වයේ තිබූ අතර මෙම සුරක්ෂිතභාවය රසායනික හෝ වෛදික මාර්ගයකින් පැහැදිලි කළ නොහැක. 1556 නොවැ. 18 වැනි දින ගෝවේ වෘතීමය දිවුරුම් දීමක් මත සහතික කොට ප්‍රකාශ කරමි."



රාහුල හිමියන්ගේ දේහය තැන්පත්කර ඇති ගෝවේ වෙල්හා බැසිලිකාව

දොස්තර රිබේරියෝ වන මම මෙම පූජනීය දේහය රිසිසේ පරීක්ෂා කළෙමි. පාද සිට දණහිස් දක්වා සහ දෙඅත් ද පරීක්ෂා කළ අතර සම්පූර්ණ සිරුර මාංශ පේශීන්වලින් වැසී, ස්වාභාවික වර්ණයෙන් යුතුව හොඳින් සුරැකී තිබිණි. මාංශ ඉතා මෘදු සහ තෙත් ගතියෙන් යුක්ත විය. වම් පාදයේ දණහිස මත පිටතින් ඇඟිල්ලක තරමේ එක පහරකින් සිදුවූ තුවාලයක් වූ අතර පිටවූ පසු කාලයක් තිබීමෙන් කළු පැහැගැන්වූ ලේ පැල්ලම් තුවාලය වටේට දක්නට ලැබිණ. උදරයේ ද වම් පැත්තේ තුවාලයක් වන් කුඩා සිදුරක් දුටුවෙමි. එම සිදුර තුළින් මා ඇඟිල්ලක් දැමූ අතර පළමුව එහි රික්තයක් වූ නමුත් තව දුරටත් එබීමේදී වියළී ගිය අතුණුබහන් ස්පර්ශ කිරීමට හැකි විය. මම කොපමණ යටට අත දැමුවත් කිසිම දුර්ගන්ධයක් මට නොදැනුණි. හිස යට කුඩා මෙට්ටයේද, දණහිස් මත මෙන් දීර්ඝකාලීනව පිටවූ රුධිරයේ පැල්ලම් දක්නට ලැබිණි. මේ සියල්ල මා 1556 දෙසැ. 1 වන දින නිරීක්ෂණය කළෙමි. මෙම වෛද්‍ය වාර්තාවෙන් සනාථ කරනුයේ දේහය කිසිම එම්බාම් කරණයකින් තොරව නරක් නොවී තිබෙන අයුරුය. මෙසේ වී ඇත්තේ රාහුල හිමි අපවත් වීමට මොහොතකට කලින් ඉතා ප්‍රබල "සිදුඅළුරසය" නමැති ඖෂධයක් පානය කළ නිසා බැව් සිංහලයන් විශ්වාස කරයි.

## සාන්ත සේවියර් පියතුමාගේ දේහය තිබුණේ කොයිවිදියටද ?

රාහුල දේහයේ දෙපා



අද ගෝවේ පල්ලියේ තබා තිබෙන ශාන්ත සේවියර් පියතුමාගේ යැයි කියනු ලබන දේහයේ තිබෙන තුවාල, අතුරුදන් වී ඇති අවයව පිළිබඳව එතුමා පිළිබඳව නිකුත් කොට ඇති පොත්පත්වල සඳහන් වී ඇති අයුරු මීට ඉහත පෙන්වාදී තිබේ. මියගිය සිරුරක් ආශ්චර්යයක් මෙන් නරක් නොවී තිබෙන විට එහි කැබැලි කඩා ගනිමින්, අතපය කපා දමමින් කෲර ලෙස නැවත වළලමින් කටයුතු කළා යැයි නිකුත් කරන ප්‍රකාශ පිළිගැනීමට අපහසුය. එවිට එය මෙම සිරුරේ තිබෙන්නා වූ තුවාල "සාධාරණය" කිරීමට ගත් ප්‍රයත්නයක් ද යන්න ගැන සැක පහළ කිරීම පුදුමයට කරුණක් නොවේ.



දේහයේ හස්තය

මෙම දේහය අඩංගු මිනී පෙට්ටිය වර්ෂ 1751 දී, ගෝවේ හිටපු පෘතුගීසි ආණ්ඩුකාර ඩී ලුවිස් කයිමානෝ ඩි අල්මේදාට නැරඹීම සඳහා විවෘත කළ පසු ඔහු විසින් දේහයේ තත්ත්වය පිළිබඳ වාර්තාවක් "නොටිසියස් ඩි කෝර්පෝ ඩි ග්ලෝරියෝසෝ සැම් ෆ්‍රැන්සිස්කෝ සේවියර් "නමින් නිකුත් කොට ඇත. එම වාර්තාව අනුව දේහය එවකට තිබූ තත්ත්වය ඔහු පවසා ඇති අන්දමින් මෙසේය.

"මෙහි දකුණු අත නොමැති අතර එය කපා රෝමයට යැවූ බව වාර්තා වේ. රත්තරන් යෂ්ටියක් සහිත වම් අත පෙනේනට තිබේ. මෙම පූජනීය අත වියළී ඇති නමුත් ඇඟිලි සහ නියපොතු පැහැදිලිව පෙනෙන්නට තිබේ. දේහයේ පූජනීය පාදයන් ද වියළී ගොස් ඇති අතර දකුණු කකුලේ කුඩා ඇඟිල්ල නොමැති අතර එහි රතුපාට රිබන් එකක් බැඳ ඇත. අනෙක් පා ඇඟිලි නියපොතු දක්නට තිබේ. පූජනීය මුහුණ නැවුම් නමුත් සුදුමැලි වී ඇත. හිස සහ නලල තරමක් විශාලයි. ඇස් පියා ඇත. ඇස් බැමි, රැවුල, මුහුණ එකම පාටය. නාසය, ගොරෝසු අතර දකුණට ආනත වී ඇත. මුහුණ පපුව දෙසට නැමී ඇත."

මෙම වාර්තාව නිකුත් වී වසර 31 කට පසු මේරි නම් රැජනගේ අණ පරිදි 1782 ජනවාරි මස 1 වන දින දේහය පිළිබඳව තවත් නිල වෛද්‍ය පරීක්ෂණයක් පවත්වන ලදී. වෛද්‍ය ෂෙලිසියානෝ රාමෝස් මෙම පරීක්ෂණය පැවැත් වූ අතර එය නිරීක්ෂණය කිරීමට ආණ්ඩුකාරතුමා, කපිතාන් ජනරාල්වරයා, පරිපාලන නිලධාරී සහ ගෝවේහි පූජක අධිකාරියේ බලධාරීන් පැමිණ සිටි අතර පසුදින පහත සඳහන්

වාර්තාව ඉදිරිපත් කර ඇත.

"අති අභිමානවත්, ආණ්ඩුකාර ෆෙඩ්රික් ගිල්ගර්ඩ් ඩි සොයිසා සාමිවරයාණෙනි, උතුම් වූ රජනගේ අණ පරිදි පූජනීය දේහය කුමන තත්ත්වයේ තිබේද යන්න පරීක්ෂා කිරීමට එය බහාලූ පෙට්ටිය විවෘත කළ අතර එම දේහයට අදාළ පූජනීය සළු අන්දවා තිබිණ. හිස සුරක්ෂිතව තිබූ අතර හිසකෙස් කුඩා ප්‍රමාණයක් හිස් කබලේ තිබිණ. මුහුණ දකුණු පැත්ත සීරීමකට අමතරව මනාව සුරක්ෂිතව තිබූ අතර, හොඳ වර්ණයෙන් ද, සමින්ද වැසි තිබුණි. කන් දෙකම හොඳ තත්ත්වයේ තිබූ අතර එකක් නැර දත් සියල්ලම තිබුණි. වම් අත සමින් වැසී ස්වභාවික වර්ණයෙන් යුක්ත වූ අතර දකුණු අත දක්නට නොවීය. ජේසුස් හා ශේරාගේ කාලයේ මෙම අත කපා රෝමයට ගෙන යන ලදැයි ජනප්‍රවාදයක් පවතී. ශරීරයේ අනෙකුත් අවයවයන් පරීක්ෂා කිරීමේදී අතුනුබහන් නොමැති බව නිරීක්ෂණය කරන ලදී. කලවායන්හි සම ගැලවී යමින් තිබූ නමුත් පාදයන්හි සම තිබූ අතර නහර ඉලිප්පී පෙනෙන්නට තිබුණි. පාදවල එක් ඇඟිල්ලක් නැතිව අන් සියලුම ඇඟිලි සහ නියපොතු ද වි්ය. පාදයේ එක් ඇඟිල්ලක් නොතිබූ අතර එය එක්තරා භක්තිමත් කාන්තාවක් විසින් ඩැහැ ගන්නා ලදුව දැන් එය ජනරාල්වරයාගේ නිවාසයේ තිබේ.

මෙම දේහය පිළිබඳව ඉන්පසු පශ්චාත් මරණ පරීක්ෂණ 3 ක් පවත්වා ඇති අතර එම විස්තර කෙටියෙන් මෙසේය.

වර්ෂ 1859 දී වෛද්‍ය පිලිප් මේරි සේවියර්ගේ වාර්තාව - සිරුර වෛද්‍යවරුන් විසින් පරීක්ෂා කරන ලදී. හිස් කබල සමින් සහ යාන්තමට වැඩුණු කෙසින් වැසී තිබූ අතර හිස් කබලේ වම් පැත්තේ කෙස් නොවීය. මුහුණ කර්කශ වී ඇති අතර කාලවර්ණයෙන් යුත් දකුණු පැත්තේ සීරීමක් නිසා විවෘත වීමක් දක්නට ලැබේ. එක් දතක් හැර අනෙක් දත් සියල්ලමද, කන් දෙකද දක්නට ලැබෙන අතර දකුණු අත නොමැත. වම් අතේ ඇඟිලිවල නියපොතු ඇති අතර උදරයේ බිත්ති කර්කශ වී දුර්වර්ණ වී ඇති අතර අතුනුබහන් නොම්ැත. පාද ද කර්කශ වී ඇති අතර දකුණු පාදයේ 5 වැනි 4 වැනි ඇඟිලි නොමැත.

සාමාන්‍ය මිනිසකුට වඩා මෙම සිරුර කුඩා බව පෙනෙන අතර එය නහර වියළීමෙන් සහ කර්කශ වීමෙන් සිදුවිය හැක. හිස කඳෙන් වෙන්ව ඇති බව පෙනුණත් හොඳින් නිරීක්ෂණය කිරීමේදී එසේ වෙන්වීමක් දක්නට නොලැබිණ.

වර්ෂ 1923 දී වෛද්‍ය ෆ්‍රැන්සිස්කෝ සහ වෛද්‍ය කොන්රියෝ වොල්ෂන්ගෝඩී සිල්වාගේ වාර්තාව

වර්ෂ 1923 අගෝස්තු 23 වැනි දින සෞඛ්‍ය සේවයේ අධ්‍යක්ෂ වෛද්‍ය ෆ්‍රැන්සිස්කෝ විසින් සිරුර පරීක්ෂා කරන ලදී. ඔහු පරීක්ෂා කළේ සිරුරේ ආවරණය නොවූ කොටස් පමණි. සිරුර විජලනය /කර්කශ වී ඇති අතර සමහර ස්ථානවල අස්ථීන් දැක්මට ලැබේ. මුහුණ, කන්වල, හැඩය, ඇස් පිහාටු වසා ඇති වැස්ම නියම විදියට සුරක්ෂිතව තිබේ. සිරුර බහාලූ පෙට්ටියේ දිග මීටර 1.52 ක් වන අතර සිරුරේ දිග මීටර් 1.44 කි. හිසෙහි කෙස් රොද ස්වල්පයක් ඇත. මුහුණේ වම්පැත්තේද රැවුල්මෙන්

කෙස් ඇත. කන්වල හැඩය නියම ස්වරූපයට තිබෙන මුත් ඒවා ඝන වී ඇත. දත් 3 ක් දක්නට ලැබේ. වම් අතේ මහපටඇඟිල්ලේ නියපොත්ත තිබෙන අතර 3 වැනි සහ 4 වැනි ඇඟිලිවල නියපොතු ස්වල්පයක් ඇත.

වර්ෂ 1953 දී වෛද්‍ය අන්තෝනියෝ ද සිල්වාගේ වාර්තාව (අවසාන වෛද්‍ය පරීක්ෂණය)

දැනට මෙම සිරුර බහා ඇති මිනී පෙට්ටියේ සහ සිරුරේ මිනුම් මෙසේය.
(1923/9/27 වැනි දින ගන්නා ලද මිනුම් වාර්තාවට අනුව)
මිනීපෙට්ටියේ අභ්‍යන්තර දිග මීටර් 1 සෙ.මී. 52 1/2
සිරුර (හිස ඉදිරියට නවා) - මීටර් 1 සෙ.මී 41 1/2
සිරුර (හිස කෙලින්) මීටර් 1 සෙ.මී. 46

අඩි පහමාර (සෙ.මී. 169) නම් මිනී පෙට්ටිය ඊට වඩා කෙටි වුණේ ඇයි?

වර්ෂ 1953 සැප්. 27 වැනිදා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ලේකම්ගේ ඉල්ලීමක් පරිදි කරන ලදී. "මෙම ශරීරය මෙසේ තබාගත් ආකාරය ගැන කීමට අසීරුයි. එය මමීකරණය වූවක් හෝ ගල්වූවක්ද නොවේ පාදවල මෘදු කොටස්, මේ මොහොතේ එම්බාම් කළාක් මෙන් දැනේ. සාමාන්‍යයෙන් මෙම සිරුර එම්බාම් කරනලද සිරුරක් සේ පෙනෙයි."

උක්ත පශ්චාත් වෛද්‍ය පරීක්ෂණ වාර්තාවලින් සිරුරේ නියම තත්ත්වය අපට අවබෝධ කර ගත හැක. එය පසුව මෙම දේහය රාහුල හිමියන් යැයි යන තර්කය සනාථ කිරීමට ඉවහල් වන බැවිනි.

## දේහයේ උස අඩුවීම ගැන කියන හේතු සාධාරණද?



දකුණු අත නොමැති දේහය



රාහුල හිමිගේ දේහය

කතෝලික බැතිමතුන් විසින් ඉදිරිපත් කර ඇති වාර්තාවට ශාන්ත සේවියර් පියතුමා ජීවත්ව සිටින විට අඩි 5 1/2 ක් එනම් මී. 1. සෙමී. 69 ක උසින් යුක්ත බැව් කියෑවේ. නමුත් සිරුරේ මිනුම් ගත් විට හිස කෙලින් තබා දිග මී. 1 සෙ. මී. 46 ක්වේ. ඔවුනට අනුව මළ සිරුරෙහි දිග අඩුවීම සාධාරණීය කර ඇත්තේ මෙසේය.

(අ) කලවා ඇටය සෙ. මී. 5 ක් පමණ පහළට ඇදී යෑම

(ආ) ශත වර්ෂ 4 ක් තිස්සේ සිරුරේ වේලීම නිසා අස්ථි බන්ධනීන්ගේ සම්පීඩනය හේතුවෙන් සිරුර හැකිළීම.

(මෙම සාධාරණීයකරණය ඒ සම්බන්ධයෙන් වන වෛද්‍ය මතයට එකඟ නොවන බව සිංහලයෝ පවසති)

ඉහත සඳහන් කරුණු කතෝලිකයන් විසින් මෙම සිරුර ශාන්ත සේවියර්ගේ ය යන්න තහවුරු කිරීමට ඉදිරිපත් කරන ලද ඒවාය. ඔවුන්ට අනුව ෆ්‍රැන්සිස් සේවියර් පියතුමා දුප්පත්, අඩු පහසුකම් ඇති අයට, රෝගීනට, දුක් පීඩා විඳින්නන්ට උපකාර කළ නිතර යාඥා කරමින් දෙවියන් වහන්සේට සමීපව ජීවත්වූ අයෙකි. එබැවින් එවන් උතුමෙකුගේ සිරුර සාමාන්‍ය කෙනකුගේ සිරුරකට ස්වාභාවිකව වන දේ නොවී දෙවියන්ගේ කැමැත්ත මත මෙලෙස නරක් නොවී තිබුණු බවට ඔවුන් විශ්වාස කරන අතර ඒ සම්බන්ධයෙන් පොත්පත් ගණනාවක්ද ලියා ඇත.

නමුත් ගෝවේ දැන් තබා තිබෙන, ශාන්ත සේවියර්ගේ යෑයි කියනු ලබන එම දේහය වෙන කාගේවත් නොව රහල් හිමියන්ගේ යෑයි සිංහලයෝ එදා සිට තරයේ විශ්වාස කරයි. එසේම එය සනාථ කිරීම සඳහා තර්කානුකූලව කරුණු ඉදිරිපත් කරති. 20 වන ශත වර්ෂයේදී දේශීය බෞද්ධ ආයතන ගෝවේ බලධාරීන්ගෙන් මෙම දේහය තම රටට ලබා දෙන මෙන් ඉල්ලා ලිපි පවා යවා ඇත. එවකට පැවැති "සිංහල බෞද්ධයා" නම් පුවත්පතෙහිද (1953 දෙසැ( 27) මෙම දේහය රාහුල හිමියන්ගේ බැව් සනාථ කරන කරුණු දක්වා ඇත.

සිංහලයන් විසින් තම තර්කය, එනම් මෙම දේහය ශාන්ත සේවියර්ගේ නොව රාහුල හිමිගේම යැයි යන තර්කය සනාථ කිරීම සඳහා ඉදිරිපත් කර ඇති කරුණුවලින් සමහරක් මෙසේ ය.

(අ) යුරෝපීය ජාතිකයන් තම හිසබූගැමේ පිළිවෙතක් කිසි කලෙක අනුගමනය කොට නැත. විශේෂයෙන් එලෙස එය වහල් බවේ සංකේතයක් සේ සැලකූ බැවිනි. ශාන්ත සේවියර් ජීවත්වූ කාලයේ ස්පාඤ්ඤ හා අනෙක් යුරෝපීය කතෝලික පූජකවරුන් තම හිසකෙස් සහ රැවුල දීර්ඝ ලෙස වැවීම පුරුද්දක් කොට තිබුණි. වර්තමානයේදී වුවද රෝමානු කතෝලික ස්පාඤ්ඤ පූජකවරුන් කොණ්ඩය බූ ගාන්නේ නැත. නමුත් මෙම දේහයේ හිසෙහි කෙස් ඇත්තේ සම්පූර්ණයෙන් බූ ගෑ පසු දින 2 කට හෝ පසුව මතුවන ප්‍රමාණයක පමණි. රැවුලද එසේමය. නමුත් ඇහි බැමෙහි සම්පූර්ණයෙන්ම කෙස් වැවී ඇත. එසේ නම් ඇහි බැමිවල සම්පූර්ණයෙන් කෙස් තිබීමටද, හිසෙහි කෙස් නොතිබීමටද හේතුව කුමක් විය හැකිද? එකම හේතු වනම් මියගිය තැනැත්තා නිතිපතා කොණ්ඩය සහ රැවුල බෑමට පුරුදුවී සිටි අයෙකු වීමයි. සේවියර් පියතුමා එසේ නොකළ බව කව්රුත් දනී.

(ආ) පැරණි යුරෝපීය සංස්කෘතියෙහි මිනිසුන්ගේ නොව ගැහැනුන්ගේ ද කන් සිදුරු කිරීමේ චාරිත්‍රයක් නොවිනි, රහල් හිමි කල ආභරණ පැළඳීම සඳහා "ක්ෂත්‍රිය" පුද්ගලයන්ගේ කන් සිදුරු කිරීමේ චාරිත්‍රයක් පැවතුණි. එසේම උපසම්පදා උත්සවයේදී භික්ෂූන්ගේ කන් සිදුරු කිරීමේ චාරිත්‍රයක් වූ බැව්ද ඉතිහාසය සාක්ෂි දරයි. එසේ නම් මෙම දේහය සේවියර් පූජකතුමාගේ නම් එහි කන් සිදුරු වූයේ කෙසේ ද?

(ඇ) සේවියර්තුමා ස්පාඤ්ඤ ජාතිකයෙක් වූ අතර යුරෝපීයයන් අතරේÊ වුවද ස්පාඤ්ඤ ජාතිකයෝ බෙහෙවින් සුදු හමකට (වර්ණයකට) හිමිකම් කියති. නමුත් මෙම දේහයේ වර්ණය තළඑළළු හෙයින් එය ආසියානු ජාතිකයෙකුගේ මිස කිසිසේත්ම යුරෝපීය ජාතිකයෙකුගේ විය නොහැක.

(ඈ) මෙම දේහයේ ඇස් නිල්පාට නමුදු ස්පාඤ්ඤ ජාතිකයනට සාමාන්‍යයෙන් තිබෙන්නේ දුඹුරුපාට බළල් ඇස්ය.

(ඉ) දේහයේ දකුණු අත නොමැත. වාර්තාගත වන අන්දමට වර්ෂ 1614 නොවැ. 3 වන දින පෝල් පාප් වහන්සේගේ ඉල්ලීම පරිදි එම දකුණු අත කොටස් 3 කට කපා එක් කොටසක් මැකාවෝ විදුහලටද අනෙක් කොටස මලක්කාවටද, ඉතිරි කොටස රෝමයටද යවා ඇත. කතෝලිකයන් අතිශය ලෙස ගෞරව කරන, එවන් වූ වටිනා වස්තුවක් මෙවන් වූ කෲර ඉරණමකට භාජන කරත් දැයි සිතිය හැකිද? පෝල් පාප් වහන්සේ එවන් ඉල්ලීමක් සත්‍ය වශයෙන්ම ඉදිරිපත් කොට තිබුණේ නම්, සම්පූර්ණ අතක් වෙනුවට කුඩා ඇඟිල්ලක් කපා යැවීමට නොහැකි වූයේ මන්ද? නො එසේ නම් එම "අත" කපා ඉවත් කළේ එවන් වූ ඉල්ලීමකට වඩා එම අතෙහිවූ තමන් නොකැමති යම් කිසි "ලකුණක්" තිබූ නිසාද? පාප් වහන්සේගේ ඉල්ලීම පරිදි කොටසක් රෝමයට යැව්වා නම් ඉතිරි කොටස් අනෙක් පෙදෙස්වලට

යෑව්වේ කාගේ ඉල්ලීම පරිදි ද?

(සිංහලයන් විශ්වාස කරනුයේ රහල් හිමිගේ දකුණු අතෙහි තමන් හඳුනා ගැනීම සඳහා "සතුරු බුවනෙකබා බලය තෙව්වටක් පසුබා රුපු යුදයට නොබා, මමය පැරකුම් රජුගේ ගජබා යන කවියද "සවර" ලද මුල් කඳ" යන කවියද කොටා තිබූ බව සහ මෙම අත සිරුරෙන් ඉවත් කර ඇත්තේ එම දේහය සේවියර් පියතුමාගේ නොවේය යන්න ඉන් තහවුරු වන නිසාය).

(ඊ) රෝමානු කතෝලික පූජකවරු සාමාන්‍යයෙන් "ඔඩිසන්" නමැති ක්‍රියාවලිය අතරතුර තම හිස වටේට කවාකාරව "බොන්සෝර්" නමින් හඳුන්වන කෙස් සිඳීම කරන අතර තමා මිය යනතුරුම එසේ තබා ගනිති. මෙම සිරුරේ එබඳු දෙයක් නොමැත.

(එ) වාර්තාවලට අනුව ශාන්ත සේවියර්තුමා වර්ෂ 1507 අප්‍රේල් මස 7 වැනි දින උපත ලබා 1552 දී මිය යන විට වයස අවුරුදු 46 කි. නමුත් මෙම දේහය එවන් තරුණ දේහයක් නොව ඉතා වයස සුදුකෙස් නෙරා ඇති ආසියානු ජාතිකයකුගේ බව පෙන්නුම් කරයි.

(ඒ) ශාන්ත සේවියර්තුමාගේ උස අඟල් 66 කි. සාමාන්‍යයෙන් කෙනෙක් මියගිය විට සිරුර අඟල් 1-2 කින් පමණ දික්වේ. එවිට සේවියර්ගේ දේහයේ දිග අඟල් 67 1/2 ක් වත් විය යුතුය. නමුත් මෙම දේහයේ දිග අඟල් 60 ක් පමණ වේ. එබැවින් අනිවාර්යයෙන්ම මෙය සේවියර්ගේ විය නොහැක.

(ඒ) මරණ පරීක්ෂක වාර්තාවනට අනුව දේහයේ මරණීය තුවාල ඇති බැව් වෛද්‍යවරු සහතික කරති. සේවියර්තුමා ඉතා ශාන්ත ගුණයන්ගෙන් හෙබි අතර අවසාන කාලයේ ඔහුව බලා ගැනීම සඳහා ඔහුගේ මිතුරන් ද විය. එසේනම් ඔහුගේ දේහයේ මරණීය තුවාල ඇති වීමට හේතුව කුමක්ද? (ජනප්‍රවාදයට අනුව 1552 දී පෘතුගීසීන් අම්බන ගුහාවේ සිට දේහය පැහැරගෙන යෑමට සැරසෙන විට ගම්වාසීන් එයට විරුද්ධව සටන් කර ඇත. එම ප්‍රදේශය අදටත් "ඇවිලුම" ලෙස හඳුන්වයි. සිරුරට තුවාල වී ඇත්තේ මෙම අවස්ථාවේය යන්න සිහලුන්ගේ විශ්වාසයයි.

## දේහයේ ඇට කටු දිරනවාද?






වර්ෂ 1922 දී වෛද්‍ය ඇන්තෝනියෝ මිල්ෆ්ගන්ග් ඩි සිල්වා විසින් එම දේහය පරීක්‍ෂා කොට මෙසේ කියා තිබේ. මෙම දේහය විජලනය හෝ මමිකරණය කළ එකක් නොවේ. කකුලෙන් බත් කෙන්ඩෙහි මෘදු බව නිසා එය ළඟදී එම්බාම් කරන ලද සිරුරක් සේ පෙනේ. සාමාන්‍යයෙන් මෙය බෙහෙත් ගැල්වූ සිරුරක් බවට නම් කළ හැක. යනුවෙනි. ශාන්ත සේවියර්තුමාගේ සිරුර නරක් නොවී තබාගැනීම සඳහා කිසිදු අවස්ථාවක බෙහෙත් පාවිච්චි කළ බැව් හෝ පියතුමා මිය යැමට පෙර එසේ වීමට බෙහෙතක් පානය කළ බවට හෝ කතෝලිකයන් කිසිවිටෙක කිසි තැනක ප්‍රකාශ කොට නොමැත. ඔවුන් විශ්වාස කරන්නේ මෙය දේව බලයෙන් සිදු වූවක් ලෙසය. උක්ත වෛද්‍යවරයාද කතෝලිකයකු බැවින් මෙම දේහය ඖෂධ මගින් ආරක්‍ෂා වී ඇති බැව් ඔහුට සක්සුදක්සේ පැහැදිලි නොවූයේ නම් දෙවියන් බලෙන් එසේ සිදුව ඇතැයි ඔහු අනිවාර්යයෙන් පවසනු ඇත. (සිංහලයන් විශ්වාස කරන්නේ රහල් හිමි අපවත් වීමට මොහොතකට පෙර සිරුර දින දහස් ගණනක් නරක් නොවී තබාගැනීම සඳහා 'සිදු අළු රසය' නම් බලගතු ඖෂධයක් පානය කළ බවයි.

සේවියර් පූජකතුමා ශාන්තුවරයෙක් ලෙස ප්‍රසිද්ධ කරන ලෙස ඉල්ලා කළ ඉල්ලීම් පාප් වහන්සේලා තිදෙනෙක් එනම් දහහතර වන ග්‍රෙගරි පාප් වහන්සේ, පස්වන පෝල් පාප් වහන්සේ සහ පහළොස් වන ග්‍රෙගරි පාප් වහන්සේලා විසින් තෙවරක්ම ප්‍රතික්ෂේප කරන ලද අතර එතුමා ශාන්තුවරයෙක් ලෙස නම් කරන ලද්දේ 1624 දෙසැම්බර් 6 වැනි දින අටවන උර්බන් පාප් වහන්සේ විසිනි. ඉහත ප්‍රතික්ෂේපයන් තුළින් පෙන්වන්නේ එම පාප් වහන්සේලා මෙම දේහය සේවියර්ගේ බවට නොපිළිගත් බව නොවේද?

කතෝලික පූජකවරු එම කාල වකවානුවේදී ප්‍රකාශ කිරීමට යෙදුනේ එම දේහය නරක් නොවී පවතින්නේ සර්වබලධාරී දෙවියන් වහන්සේගේ බලය නිසා බවය. නමුත් දැන් එය ක්‍රමක්‍රමයෙන් දිරාපත් වන බව වෛද්‍යවරු සනාථ කරති. තවද එහි ඇටකටු ද දිරමින් පවතී. චීන සහ ඊජිප්තුවේ

මමීකරණය කරන ලද දේහයක්, ඖෂධ බලයෙන් අවුරුදු 5000 ක් පමණ කාලයක් සුරැකී තිබෙන නමුත්, දෙවියන් වහන්සේගේ 'ආශිර්වාදය' ලැබූ මෙම දේහය අවුරුදු තුන්හාරසියයකට පසුව දිරාපත් වන්නට පටන්ගෙන තිබේ. එයට හේතුව 'ඔෂධවල' බලය දෙවියන්ගේ බලයට වඩා වැඩි නිසාද? නැත. එයට හේතුව බුදු දහමට ද අනුව රහල් හිමිගේ දේහයට ද 'සියලු දේ අනිත්‍යය' යන න්‍යාය බලපාන බැවිනි.

ආචාර්ය උභයසේකර (1934) මහතාගේ තර්කය

ආචාර්ය උභයසේකර මහතා තම 'ශ්‍රී ලංකාදීප වර්ණනා' නම් කෘතියේ (වර්ෂ 1934) ගෝවේ තබා තිබෙන දේහය රාහුල හිමියන්ගේම බැව් සාධක සහිතව සනාථ කිරීමට කරුණු ඉදිරිපත් කරයි. ඔහු ප්‍රථමයෙන් සියවස් පහක් තිස්සේ මුවින් මුව පැමිණි ඒ හා සම්බන්ධ ජනකවි දෙකක් පිළිබඳව සඳහන් කරයි.

(එම කවි දෙක මීට පෙර සඳහන් කොට ඇත.)

එයින් පළවන කවියෙන් කියනුයේ 'මන්ත්‍ර බලයෙන් වසර දහසක් සුරක්ෂිතව' තබාගත් සිරුර අඩංගු ගුහාව යක්ෂයන් ආරක්ෂා කළ බවත්, සාවියර් නමැති සතුරු පෘතුගීසි ජනරාල්වරයා සහ එම හමුදාව උතුම් රාහුලගේ සිරුර ගෝවේ නගරයට ගෙන ගොස් තැබූහ. යන බවත්ය.

ආචාර්ය උභයසේකරයන් තර්ක කරනුයේ මෙම ජන කවියෙන් කියැවෙන සාවියර් නමැත්තා අන් කිසිවකු නොව ෆ්‍රැන්සිස් සාවියර් බවත්, එවකට සිටි ලංකාවේ රජු දොන් ජුවන් ධර්මපාල කතෝලිකයකු වූ බැවින් එම සිරුර රටින් පිට කිරීමට සහාය දී ඇති බවත්ය. තවද පෘතුගීසීන් දකුණේ ජනතාව භීතියට පත් කරමින් කෲර ලෙස පාලනය කළ බැවින් මෙය ශතවර්ෂ 3 ක් පමණ රහසක්ව තබා ගැනීමට හැකිවූ බවත් ඉන්පසු සියල්ලන්ටම එය අමතක වන්නට ඇති බවත් ඔහු පවසයි. තවදුරටත් ඒ සම්බන්ධයෙන් කරුණු දක්වන ආචාර්යවරයා මෙසේ කියයි. රාහුල හිමි අම්බන අපවත් වූ අතර ප්‍රදේශයේ ජනතාව දේහයට ඉමහත් ගරුසරු දක්වමින් සිටියහ. වර්ෂ 1552 දී පෘතුගීසි ජනරාල් ෆ්‍රැන්සිස් සේවියර්ගේ හමුදාව සිංහලයින් සමඟ සටන් කොට දේහය රටින් පිටකරන ලදී, එම සටන තුළදී දේහයට මරණීය තුවාල සිදුවිය හැකි බැව් පිළිගත හැකි කරුණකි. සේවියර් "ශාන්තුවරයෙක්" යැයි කියනා නිසා එවන් ශාන්තුවරයකුගේ සිරුරේ මරණීය තුවාල තිබිය හැක්කේ කෙසේද? (ඉතිහාසඥ පී. ඊ. පීරිස් තම පෝචුගිස් 1505-1695 නමැති කෘතියේ ලංකාවට පැමිණි සේවියර් නමැත්තා ශාන්ත සේවියර් යන නම ලබාගත් කතෝලික ආගම වැළඳගත් කෙනෙක් බව පවසයි.)

'ශ්‍රී ලංකාද්වීප වර්ණනා' නම් පොතෙහි ආචාර්ය උභයසේකරයන් විසින් දක්වන ලද කරුණු සංක්ෂිප්තව මෙසේය.




ෆ්‍රැන්සිස් සේවියර් වර්ෂ 1552 දී දොන් ජුවන් ධර්මපාල රජ සමයේ ලංකාවට පැමිණියේය. රජු කතෝලික බැතිමතෙකු වූ අතර පෘතුගීසීන් සමඟ සුහදව සිටි බැවින් රජුගේ ද ආශිර්වාදය මත සේවියර් දකුණු වෙරලබඩ තීරයේ සිහලුන් කතෝලික ආගමට හැරවීම සඳහා දේශනා පවත්වමින් කටයුතු කළේය. මෙම ක්‍රියාදාමය අතරතුර ඔහු 'අම්බන' තිබෙන මෙම දේහය පිළිබඳව දැනගෙන එය මලක්කාවට ගෙන යැමට කටයුතු කළේය.

රාජකීය ආසියාතික සමාගමේ 60 වන සංස්කෘත සඟරාවේ 159 වැනි පිටුවේ සඳහන් පරිදි සාවියර් මලක්කාවේ නව ආණ්ඩුකාරවරයා ලෙස පත්වූ තම මිතුරාගේ එම උත්සවයට සහභාගි වීම සඳහා මලක්කාවට ගියේය. එසේම ඔහුගේ ජීවිත කතාව අනුව ඔහු දුර ඈත පෙදෙසක 1552 නොවැ. මස මියගිය බව දක්වන අතර එම කාලවකවානුව ඉහත සඳහන් මලක්කාවේ පැවැත්වූ උත්සවය තිබූ කාලය හා ගැලපේ.

ෆ්‍රැන්සිස් සේවියර් ජපානයේදී බුදුදහම ඉගෙන ගත් අතර ඒ බව ඔහු එස්. බීල් නමැති පූජකතුමාට, ශ්‍රී ලංකාවේ දකුණේ පවතින බුදුදහම ක්‍රිස්තියානි ආගම හා සසඳන විට සත්‍ය දහමක් සේ සැලකිය හැකි බව පවසා යැවූ ලිපියෙන් සනාථ වෙයි. ලිලි නමැති කතුවරයා විසින් ලියන ලද 'බුද්ධා ඇන්ඩ් බුඩිසම්' නමැති පොතේ 193 වැනි පිටුවේ පූජක බිල්ජසින් එම ලිපිය පාප් වහන්සේට පෙන්වා ඇති බැව් සඳහන් වේ.

## පාප්තුමාටශ්‍රී ලංකාවෙන් අභියෝගයක්...

ආචාර්ය ඒ. එච්. උභයසේකරයන් විසින් රචිත "ශ්‍රී ලංකාද්වීප වර්ණනා නම් පොතෙහි (1934) සඳහන් ඉතිරි කරුණු මෙසේය.

(ඈ) "වීදිය බණ්ඩාර" නම් පොතෙහි 58 වැනි පිටුවේ රාහුල හිමිගේ දේහය ශාන්ත සේවියර්ගේ යැයි හඟවා "එම්බ්‍රොසියා වයිගරා" නමැති නෞකාවෙන් ගෝවේ වෙත ගෙන යන ලදැයි සඳහන් වේ. (මෙම පොත පිළිබඳ වැඩි විස්තරයක් එහි සඳහන්ව නොමැත).

(ඉ) ශාන්ත සේවියර්ගේ ජීවිත කතා පොතේ 142 පිටුවෙහි වර්ෂ 1554 දී සේවියර්ගේ දේහය මලක්කාවේ සිට ලෝපස් මොරොන්හෝගේ නෞකාවෙන් ලංකාවට ගෙන එන අතරතුර ගල්පරවල හැපී විනාශ වූ බවත්, සේවියර්ගේ ඇටකටුවලින් කොටසක් ගොඩ බිමට ගෙනැවිත් ජයවර්ධනපුර පල්ලියක් අසල භූමදාන කළ බවත් සඳහන් වෙයි.

(ඊ) අටවන අර්බන් පාප් වහන්සේ, සේවියර් පූජකතුමා ශාන්තුවරයෙක් ලෙස ප්‍රකාශයට පත් කළ ලියවිල්ලෙහි කොතැනකවත් ශාන්තුවරයාගේ "සුරක්ෂිත වූ සිරුරක්" ගැන සඳහන් කොට නැත. එයිනුත් සනාථ වන්නේ එම පාප් වහන්සේ මෙම දේහය ශාන්ත සේවියර්ගේ නොවන බව දැනගෙන සිටින නිසා එවැනි සාවද්‍ය ප්‍රකාශයක් කිරීමෙන් තමන්ටද අගෞරවයක් ඇති නොවීමටය.

(උ) මෙම කාලවකවානුව තුළ බොහෝ ඉතිහාස කෘතීන් එළිදක්වා ඇත. බාරොස්ගේ ඉතිහාස පොත වර්ෂ 1551-1554 දී පෘතුගීසීන්ගේ කාලවකවානුවේදී මුද්‍රණය කොට ඇත. එහි බොහෝ වැදගත් ඓතිහාසික කරුණු අඩංගුව ඇති අතර එහි කොතැනකවත් ශාන්ත සේවියර්තුමෙකුගේ "සිරුරක්" ගැන සඳහනක් නොමැත. කරුණු ඔවුන් පවසන අයුරින් සිදුවූයේ නම් අනිවාර්යයෙන්ම ඒ සම්බන්ධයෙන් යම්කිසි දෙයක් කාලීන ඉතිහාස ග්‍රන්ථවල සඳහන් වීම වැළැක්විය නොහේ.

දැනට ඉන්දියාවේ ගෝවේ නුවර පල්ලියක තබා ඇති "දේහය" ශාන්ත සේවියර්ගේය සහ ශ්‍රී රාහුල හිමිගේය යන්න පිළිබඳව පිළිවෙළින් කතෝලිකයන් සහ සිංහල බෞද්ධයන් විසින් ඉදිරිපත් කර ඇති කරුණු ඉහත අයුරින් ඉදිරිපත් කළෙමු. ලංකාව තුළ මෙම දේහය රාහුල හිමිගේය යන්න සනාථ කිරීමට ලි˙ත සාක්ෂි තවම හමුව නැතත් රට තුළ පවතින, පරම්පරා ගණනාවක් තිස්සේ මුවින් මුව ගලා ආ ජනප්‍රවාද සහ ජන කවිවලින් එම දේහය "ගෝවේ" රටට ගෙන ගිය බැව් කියැවෙයි.

තවද මීට දශක ගණනාවකට පෙර සිංහල බෞද්ධයෝ විසින් ඉතාම ප්‍රබලව මේ පිළිබඳව කතිකාවක් ගොඩනඟා ඇති අතර මෙම දේහය රාහුල හිමිගේම යැයි සාධක පෙන්වා ඉන්දියානු රජයට ලිපි පවා යවා ඇත. කාලයාගේ ඇවෑමෙන් ඒ පිළිබඳව උනන්දුව ද ක්‍රම ක්‍රමයෙන් ගිලිහී ගොස් තිබේ.

මීට දශක 9 කට පමණ පෙර සමස්ත ලංකා ආර්යශීල මහා සම්මේලන සභාවේ සභාපති ඩී. ඇස්. ගුණසේකර මහතාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලද මහා සභාවේදී ශ්‍රී ලංකා බෞද්ධ සමිති සම්මේලනයේ ලේකම්වර ටී. යූ. ද සිල්වා මහතා මෙම දේහය පිළිබඳව රෝමයේ පාප් වහන්සේට ලියා ඇති ලිපිය මෙසේය.

"දැනට කතෝලිකයන්ගේ ගෞරව සම්මානයට භාජන වෙමින් තිබෙන ප්‍රැන්සිස් සේවියර්තුමාගේ යැයි ඔවුන් විශ්වාස කරන ශ්‍රී දේහය ආසියා ජාතිකයකුගේ ද, නැතහොත් යුරෝපා ජාතිකයකුගේ ද යන්න "ඇක්ස්රේ" පරීක්ෂණයකට භාජන කර මනුෂ්‍ය ජාතිය පිළිබඳ විද්‍යාව දත් කොමිටියක් මගින් තීරණය කොට ලෝකයට සත්‍යය හෙළි කරන ලෙස පාප්වහන්සේට දන්වනු කැමැත්තෙමි."

මීට දශක නවයකට පෙර වෛද්‍ය විද්‍යාව එතරම් දියුණු නොවූ අවධියක "එක්ස්රේ" පරීක්ෂණයෙන් මෙම ගැටලුව නිරාකරණය කර ගත හැකියි ඔවුන් සිතා ඇති බව මෙයින් වැටහේ. නමුත් වර්තමානයේ ඩී. එන්. ඒ. පරීක්ෂණයෙන් මෙම ගැටලුව කිසිදු සැකයකින් තොරව ඔප්පු කළ හැකි බව අපි දනිමු.

මෙම දේහය පිළිබඳ ගැටලුව, එනම් එය රාහුල හිමිගේමද යන්න සනාථ කිරීමට එම කාලය තුළ රට තුළ තිබූ දේශපාලනික තත්ත්වය ද වටහා ගැනීම උචිත වේ. එනම් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු දීම පිළිබඳව අපගේ අවධානය යොමු කිරීම වටී.

(අ) මෙවන් අගනා "වස්තුවක්" එනම් රාහුල දේහය, පෘතුගීසීන්ට ඉතා පහසුවෙන් රටින් පිටමං කිරීමට හැකියාවක් තිබුණේද?


(ආ) එවකට රටෙහි තිබූ දේශපාලනික තත්ත්වය තුළ එවන් දෙයක් කිරීමට පහසුවෙන් හැකියාවක් තිබුණේද?

(ඇ) එකල ලංකාවේ සිට ගෝවේවලට නිතර යැමට ඊමට ගමන් පහසුකම් තිබුණාද? (නෞකා, වරාය යනාදිය)

(ඈ) පෘතුගීසීන්ගේ හැසිරීම්/ ආකල්පයන් ගැන කල්පනා කරන විට මෙවන් අසාධාරණ, අශීලාචාර, සදාචාර නොවන කෲර දෙයක් ඔවුන් විසින් කරන ලදැයි පිළිගත හැකිද?

ඉතිහාසය පිළිබඳව අධ්‍යයනය කරන විට මේ සියලුම ප්‍රශ්නවලට පිළිතුරු ලැබෙන්නේ "එසේය, ඔව්"කියාය.

## විස්මයජනක දේහයක් රටින් පිටකළේ කොහොමද?



ඉහත සඳහන් කළ පරිදි 6 වන පරාක්‍රමබාහු රජුගෙන් පසු ඔහුගේ මුණුබුරු ජයබාහු කුමරා රජ වූ නමුත් ඉන් වසර 2 කට පසුව සපුමල් කුමරු ජයබාහුව ඝාතනය කොට සයවන බුවනෙකබාහු නමින් රජ විය. 6 වන බුවනෙකබාහු වසර 7 කට පසුව මියගිය පසු ඔහුගේ සහෝදර අම්බුළුගල කුමරු වීර පරාක්‍රමබාහු නමින් රජ විය. (6 වන පරාක්‍රමබාහු රජු පුතුන් 3 ක් හදාගත් බව එනම් සපුමල් කුමරු, ජයබාහු (පසුව රාහුල හිමි) සහ අම්බුළුගල කුමරු නැවත මතක් කර දෙමි.) වීර පරාක්‍රමබාහුගේ ඇවෑමෙන් ඔහුගේ පුතා ධර්ම පරාක්‍රමබාහු නමින් රජ විය. වර්ෂ 1505 දී පෘතුගීසීන් ලංකාවට පැමිණෙන විටදී ලංකාවේ රජ වී සිටියේ ඔහුය. එවකට ඉන්දියාවේ (ගෝවේ) ප්‍රතිරාජවරයා වූයේ ද අල්මේදාය.

ද අල්මේදාගෙන් පසුව එම පදවියට පත්ව ආ අෆෞන්සෝ ද ඇල්බොකරේක්, ගෝවේ මලක්කා සහ ඔර්මස් යන මහා වරායවල් අත්පත් කර ගනිමින් තම ආධිපත්‍යය ව්‍යාප්ත කිරීමේ නව ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම ආරම්භ කළේය.

මෙම කාලවකවානුව තුළ පෘතුගීසීන්ගේ ප්‍රධානතම අරමුණ වූයේ ඒ වන විට වෙළෙ[1] ම සඳහා මුස්ලිම්වරුන් විසින් සම්පූර්ණයෙන්ම පාහේ පාලනය කළ මුහුදු ගමන් මාර්ගයන් තම අණසකට පත්කර ගැනීමය. එම කර්තව්‍යය ඔවුන් ඉතාමත් කෲර ලෙස කරමින් කේප් තුඩුවේ සිට නාගසාකි දක්වා තම බලය තහවුරු කරගති.

ධර්ම පරාක්‍රමබාහුගෙන් පසු විජයබාහු රජ වූ අතර ඔහුට සිහසුන සඳහා නිතර ආරවුල් ඇතිකර ගත් පුතුන් තිදෙනෙක් වූහ. අවසානයේ ඔවුන් තම පිය රජු මරා වැඩිමලා බුවනෙකබාහු නමින් ද දෙවැන්නා පරරාජසිංහ නමින් රයිගම් කෝරලයේද, බාලයා කෝa ට්ටේ සීතාවක සිට උඩරට දක්වා මායාදුන්නේ නමින් ද රජ විය. ඉන්පසු මායාදුන්නේ සහ බුවනෙකබාහු අතර නිතර නිතර බලය රැකගැනීම සඳහා සටන් ඇතිවූ අතර ඒ සඳහා පෘතුගීසීන්ගේ සහාය වරින් වර ලබාගැනීමද සිදුවිය.

බුවනෙකබාහු රජුට "සමුද්‍රදේවී" නම් දියණියක් වූ අතර ඇය වීදියබණ්ඩාර සමග විවාහ වී ලැබූ පුත්‍රයා නම් අප කවුරුත් අසා ඇති ඒ (කු) ප්‍රකට ධර්මපාලය.

එකිනෙකා ඇනකොටා ගන්නා රජවරුන් සිටි එසමයේ රට තුළ තිබූ ඒ අස්ථාවර තත්ත්වය දඩමීමා කරගත් පෘතුගීසීහු තම අධික බලය පාවිච්චි කරමින් තම ආගම පැතිරවීමේ දුෂ්ට ක්‍රියාවලියක නිරත වූහ. තම ආගම වැළඳ ගැනීම ප්‍රතික්ෂේප කරන විට මවගේ ඇකයේ කිරි බොන ළදරුවා උදුරා උඩ විසිකොට අසිපත් තුඩ අල්ලා තුච්ඡ ලෙස මරා දැමූහ. උන්ගේ සහාය තම බලය රැකගැනීම සඳහා අවශ්‍ය නිසා බොහෝ අවස්ථාවල රජතුමා මේ කිසිවක් නොදන්නාක් මෙන් සිටියහ.

රජු එසේ කළේ පෘතුගාලයේ රජතුමාගේ අභිලාෂය වූයේ තමා පාලනය කළ අයවලුන් ක්‍රිස්තියානී ආගමට හරවා ගැනීම බැවින්, රට තුළ තම බලය තහවුරු කර ගැනීම සඳහා පෘතුගීසි යුදමය සහාය ලබා ගැනීමට නම් ක්‍රිස්තියානිකරණය සඳහා ඉඩදීම, යෙහෙකියි යන රට, ජාතිය, ආගම පාවා දීමේ චේතනාව හෙයිනි. එම 'තත්ත්වය' ප්‍රයෝජනයට ගත් පෘතුගීසීන්, ඉතාමත් කෲර ලෙස සහ ම්ලේච්ඡ සහගත ලෙස ධනය රැස්කිරීම සඳහා පන්සල් විනාශ කොට බිමට සමතලා කළ බවත්, තම අභිමතයට අනුව වැඩ නොකළ සිංහලයන් අමු අමුවේ ඝාතනය කළ බවත්, සිංහල කුල කාන්තාවන්ට කිසිම අවස්ථාවක නිදහසේ සිටීමට නොහැකි වනසේ ඔවුන්ව දූෂණය කිරීමට පටන් ගත් බවත් පී. ඊ. පීරිස් මහතා තම 'සිලෝන් ඇන්ඩ් පෝචුගීස්' නමැති කෘතියෙන් පෙන්වා දෙයි.

මේ අතරතුර ෆ්‍රැන්සිස් සේවියර් නමැත්තා ලිස්බන් නගරයේදී සේවා බලධාරී සහ උඩරට රජවරු අතර කටයුතු සම්බන්ධීකරණය කිරීමේ කටයුත්ත බාර ගත්තේය. පෘතුගීසීන් සිංහලයන්ට කරන්නා වූ මහත් අපරාධ ගැන ඉතාම කලකිරීමට පත් ඔහු විසින් 1544 මාර්තු මස 24 වන දින පෘතුගීසීන්ගේ ක්‍රියාවන් පිළිබඳව මෙසේ සඳහන් කරයි. 'මට සියලුම දේ එපා වී යුක්තිය හා සාධාරණය ගැන අල්පමාත්‍රයකුදු හැඟීමක් නොමැතිව ඉතාමත් පහත් ලෙස හැසිරෙන මොවුන් ආගමට සහ රටට කරන්නාවූ අවමානය දකිමින් අපි තවදුරටත් මෙහි කාලය නාස්ති කරන්නේ ඇයි?

වීදිය බණ්ඩාරගේ පුතා තරුණ "ධර්මපාල" ලෙස නම් කෙරිණි. වර්ෂ 1557 දී ධර්මපාල දොන් ජුවන් ධර්මපාල ලෙසින් ද ඔහුගේ බිසව දොa න කැතරිනා (පෘතුගාල රැජිනගේ නමින්) බෞතීස්ම කරන ලදී. එසේම පාප්වහන්සේ විසින් දොන් ජුවන් ධර්මපාල හට පෘතුගීසි රජුගේ විශේෂ ආරක්ෂාව දිය යුතු යැයි ද නිර්දේශ කළේය.

ධර්මපාල, අප කවුරුත් අසා ඇති පරිදි, කතෝලික පූජකවරුන්ගේ රූකඩයක් බවට පත් වී කටයුතු කිරීමට පටන් ගත්තේය. තම බලය යොදා බුදුදහම විනාශ කිරීම, දෙවියන් වහන්සේට තමාගෙන් විය යුතු සේවයක් සේ ඔහු සැලකීය. ශත වර්ෂ 10 කට අධික කාලයක් තිබූ බෞද්ධ ගොඩනැගිලි බිමට සමතලා විය. සිංහල රාජ සභාවේ බෞද්ධ අය කතෝලික බයිබල් නාම ආරූඪ කරගැනීම විලාසිතාවක් කරගත් අතර, උසස් යැයි සම්මත වූවන් "දොa න" යන නම භාවිතා කරන ලදී. පෘතුගීසීන්ව සතුටු කිරීමට සහ ඔවුන්ගේ සහාය ලැබීමට ඔවුහු පෘතුගීසි භාෂාව ද, උන්ගේ ගති පැවතුම් ද අනුකරණය

කිරීමට පටන් ගත්හ.

වර්ෂ 1550 සිට 1560 දක්වා කාලය තුළ රට තුළ තිබූ දේශපාලනික තත්ත්වය එසේ විය. ෆ්‍රැන්සිස් සේවියර් පියතුමා 1552 මිය යන විට ගෝවේ මලක්කා, කොළඹ, ගාලු වරායවල් පෘතුගීසීන්ගේ ආධිපත්‍යයට යටත්ව තිබිණ. දොඩන්දූව වරාය ඉතාම කාර්යබහුල වරායක්ව තිබූ බවද එම ප්‍රදේශයේ වැසියන් රුවල් නෞකා නිෂ්පාදනය සම්බන්ධයෙන් නම් දරා සිටි බවත් අප අසා ඇත්තෙමු.

රජවරුන් එකිනෙකා ඇන කොටා ගන්නා තත්ත්වයෙන් ප්‍රයෝජන ගත් පෘතුගීසීන් රටේ තමන්ට කැමති පරිදි කටයුතු කරමින් සිටියහ. ඔවුන් පන්සල්වල තිබූ වටිනා දෑ කොල්ල කෑහ. පිරිවෙන් කඩා බිඳ දැමූහ. ජනතාව බියෙන් වෙව්ලමින් රජුගෙන් ද සහනයක් නොමැතිව දිවි ගෙවූහ. එබැවින් මෙවන් වූ වාතාවරණයක් තුළ, පෘතුගීසීන්ට හුදකලාව විසූ බෞද්ධ භික්ෂුවකගේ "විස්මයජනක වටිනා මල සිරුරක්" සොරාගෙන රටින් පිට කිරීමට කිසිසේත්ම අපහසු නොවන බව අපට පෙනී යයි.

## දිව්‍යමය සාක්ෂිවලින් හෙළිවන්නේ කුමක්ද?



වර්ෂ 1952 දෙසැ. 7 වැනි දින "ඉරිදා ලංකාදීප" පුවත්පතෙහි පළකරන ලද එවකට මහරගම රජයේ අභ්‍යාස විද්‍යාලයෙහි කලා අංශයේ සේවය කළ කථිකාචාර්ය ටී.යූ. ද සිල්වා මහතාගේ ලිපිය ඔහුගේම බසින්ම මෙසේය.

ඖෂධ බලයෙන් මෘත ශරීරයක් වසර 1000 කට වැඩි කාලයක් නරක් නොවී තබා ගැනීමට හැකි බව වරාහ මිහිරාචාර්යයන් විසින් ප්‍රණීත වෘහත් ජාතකයෙහි දක්වන්නේය. ෆ්‍රැන්සිස් සේවියර්තුමා ප්‍රතිකාල් සෙන්පතියෙකුද සමඟ පැමිණ එම සිරුර පැහැරගෙන ගොස් ඇත. ඔහු පළමුව ගෝවේට නොගොස් මලක්කාවට ගොස් ඇත. එසේ එහි ගියේ මලක්කාවේ සිටි ආණ්ඩුකාරවරයා මාරුකර සේවියර්ගේ මිතුරකු වූ එම ආණ්ඩුකාරයාගේ සහෝදරයා එම නිලයට පත්කරන උත්සවයට සහභාගි වීමටය. එයට ඔහු සහභාගි වූ බවට රාජකීය ආසියාතික සමාගමේ 60 වන සඟරා කලාපයේ 159 වන පිටෙහිද වයිට් එමේගේ නම් පොතේ 76 වන පිටේද සඳහන් වේ. මේ ගමනේදී රෝගයක් සෑදී චීනයට ආසන්න සැන්ක්ෂන් දූපතේදී 1552 නොවැ. මස මියගිය බව එතුමාගේ ජීවිත කතාවෙහි සඳහන් වේ.

මේ දවස්වලට මලක්කාවේ ආණ්ඩු සභාවේ කටයුතු කළ සේවියර් පියතුමා සැන්ක්ෂන් දූපතෙහි මලේ කෙසේද?

එතුමා 1552 නොවැ. මස කාලක්‍රියා නොකළ බව මලක්කාවේ ආණ්ඩුකාරවරයා පත් කරන දා සිදුවූ සිදුවීම් සඳහන් සභාපතිතුමාගේ ලියකියවිලි වල සහ රාජකීය මුද්‍ර ගසාපු ලියුම්වලින්ද සනාථ වේ.

සේවියර් නොයෙක් භාෂා ශාස්ත්‍ර උගත් කෙනෙකි. පෙරදිග වේදාන්ත පොත් හා බුද්ධ ධර්මය ද උගත් අයෙකි. මෙතුමාට බුද්ධ ධර්මය සත්‍ය බව තේරුම් ගිය සාක්ෂියක් ද වෙයි. එනම් උන්වහන්සේගේ මිත්‍රයෙක් වූ ඇස්. බීල් නම් දේවගැතිවරයාට ඔහු යැවූ ලිපියයි. එනම්
"දකුණු බුද්ධාගම කතෝලික ක්‍රිස්තියානි ආගමට වඩා ජීවිතය ගලවා ගන්නට පුළුවන් සත්‍ය වූ ආගමකි. එය මට අවබෝධ වී තිබේ. එස්. බීල් පියතුමා මෙම ලිපිය පූජා පොතේ තබා තිබී ශාන්ත පාප් වහන්සේට දක්නට ලැබුණු බව ශ්‍රේෂ්ඨ පණ්ඩිතයකු වූ ආතර් ලිලී නම් ඉංග්‍රීසි ජාතිකයා ලියූ "බුද්ධා ඇන්ඩ් බුඩිසම්" යන පොතේ 193 වන පිටේ සඳහන් වෙයි.

ක්‍රි. ව. 1894 ඇලෙක්සැන්ඩර් මැන්දිස් සේනාරත්න ආරච්චි විසින් සිංහලට පරිවර්තනය කළ සාවියර්

ජීවිත කතාවෙහි (744 පිට) ඔහු ජපන් රටේ සිටි බවද, පිරිසිදු බුද්ධ භක්තියෙක් වූ බවද සඳහන් වෙයි. එහි 139 පිටෙහි සාවිර්තුමා උපන්නේ 1506.4.7 වන දින බවද මරණය සිදුවූයේ සැන්ක්ෂන් දූපතෙහි 1552 වර්ෂයේ බවද කියෑවේ. එහෙත් පරංගින් විසින් ලියූ ජීවිත කතාවෙහි මියගියේ 1555 වර්ෂයේ බව සඳහන් වෙයි. එබැවින් 1553 වර්ෂයේදී එතුමා ජීවත්ව සිටි බව මෙයින් පෙනේ.

එම වර්ෂයේම "අම්බ්‍රොa සියා වියාරා" නෞකාවෙන් සේවියර් තුමාගේ යෑයි කියනු ලබන දේහය ගෙනා බව (වීදිය බණ්ඩාර - 58 වන පිට) සහ (ශාන්ත සේවියර් ජීවිත කතාව 142 පිට) හි සඳහන් වේ. එම මෘත ශරීරය 1554 දී ලෝපස් නොරෙඥෑඥගේ නැවෙන් මලක්කාවේ සිට ලංකාවට ගෙන එන විට ගල් පරයක හැපී මාස 6 ක් සිරවී රළ වේගයෙන් නැව කැඩී සිරුරෙහි ඇටකටු කෝට්ටේ දේවස්ථානයක වළලා දැමූ බවද සඳහන් වේ.

එවිට වීදිය බණ්ඩාර පොතේ සඳහන් සිරුරත්, සාවියර්ගේ ජීවිත කතාවෙහි සිරුරත් එකක් නොව දෙකක් බව වැටහේ. වීදිය බණ්ඩාර පොතේ සිරුර සේවියර් මියයෑමට කලින් ගෝවේට ගෙන යෑමට ගිය රාහුල දේහය බවත් දැනට ගෝවේ තිබෙන දේහය සේවියර් ස්වර්ගස්ථ වීමට ප්‍රථම ගෙන යනු ලැබූවක් නිසා එය රාහුල දේහය නොවේය කියා කිව හැක්කේ කාටද?

වර්ෂ 1952 දෙසැම්බර් මස 17 දින "ලංකාදීප" පුවත්පතෙහි මෙවන් දෙයක් සඳහන්ව තිබේ. එනම් ශාන්තුවරයන්ගේ නාමාවලියට ඇතුළත් කිරීම සඳහා එකල ශුද්ධ වූ පාප් වහන්සේ සැළකල විට ශ්‍රී දේහයේ අතක් කපා රෝමයට ගෙන යන ලදුව පාප් වහන්සේ ඉදිරිපිට එම අත මේසයක් මත තිබූ පෑනක් ගෙන ෆ්‍රැන්සිස් සේවියර් යන නාමය ලියූ බව කතෝලිකයන් කියති" යනුවෙනුයි.

මීට ප්‍රතිචාර ලෙස 1953 ජනවාරි 24 වැනි දින පේරාදෙණියේ සඳසිරියේ වැසි පුරාවෘත විශේෂඥ සී. පී. කුලතිලක මහතා විසින් සිංහල බෞද්ධයා පුවත්පතෙහි (1 වන කාණ්ඩය 49 වැනි කලාපය) පළකරන ලද ලිපිය ඔහුගේම භාෂා ශෛලයෙන් මෙසේය.

"ෆ්‍රැන්සිස් සේවියර්තුමා සාන්තුවරයෙක් (අපොස්තුලුවරයෙක්) ලෙස පිළිගන්නා ලෙස ප්‍රථම වරට 13 වන ගිරිගෝරිස් පාප්තුමාගෙන් ඉල්ලා තිබේ. එහෙත් ඔහු ජපන් රටේදී බුද්ධාගම වැළඳගෙන සිටි බැව් දැනීමෙන් හෝ ඔහුගේය කියන ඔය සිරුර ගැන පවා විශ්වාසයක් නැතිවූ නිසා ඒ ඉල්ලීම පාප් වහන්සේ විසින් ප්‍රතික්ෂේප කර ඇති බව පෙනේ.

දෙවැනි වරට 5 වන පෝල් පාප් වහන්සේගෙන්ද මෙම ඉල්ලීම කර තිබේ. එවිට එම පාප් වහන්සේ ඔය සාවියර්තුමාගේය යන සිරුරින් අතක් ගෙන්වා බලා, එය "ශුභවර්ණ" දේa හයකින් යුක්තව සිs ටි අයෙකුගේ අතක් නොවූයෙන්ද සේවියර්තුමා ලංකාවෙන් පැහැරගෙන මලක්කාවට සොරා රැගෙන ගිය විට එහි එදා පැවැති සභාවකදී මිථ්‍යාදෘෂ්ටි කෙනෙකුගේ මෘත ශරීරයක් සඟවාගෙන එහි ආ යෑයි චෝදනාවක්ද එතුමාට ලැබ ගන්නට වූ බවද සැලව තිබූ ඒ "අශුභ" සිරුරේ අත ඒ විය හැකි බවද එතුමා ප්‍රත්‍යක්ෂව දැක, පූර්වෝක්ත දොa ෂාරෝපණ ගැනත් සලකා එම ඉල්ලීමද එම පාප්තුමා පිළිකෙව් කළ



බව දැනේ. එසේ නොවේ නම් ඒ අත්භූත අත තිබූ සිරුර හිමි සාවියර්තුමා (ශුද්ධවූ) කෙනෙකු ලෙස එදාම ඒ පාප්තුමා පිළි නොගෙන නොසිටී යැයි හිතා ගන්නට තරම් නුවණැති එකම කතෝලික උගතෙක් වත් අද මේ ලෝකපතයේ ඇත්තේම නැද්ද?

තවද ඒ හම හා ඇඟිලි වියළී තිබූ අතින් පෑනක් ගෙන ෆ්‍රැන්සිස් සේවියර් යන නාමය ලියා පෙන්වා ලෝකයේ ඇති වූ බව ඇසූ එකම මහා ප්‍රාතිහාර්යයද එදා මේ අත පෑ බව දෙසැ. 17 වන "ලංකාදීප" පුවත්පතේ තිබුණි. එය එසේ වී නමුත් එතරම් දිව්‍යමය සාක්ෂියකින්වත් ඒ අත තිබූ සිරුර ඔය සාවියර්තුමාගේ යැයි අදෘශ්‍යමාන දේව බල මහිමයක් පවා ඇතැයි කියන නොවරදින සුළු නියම ශුද්ධවන්ත පාප් උතුමන්ලා දෙදෙනෙක් හා එවන් දිව්‍යමය ශුද්ධ වූ සභාවත් එක ලෙසම දෙවරක් අවිශ්වාසයෙන් ප්‍රතික්ෂේප කළ ඔය සිරුර සාවියර්තුමාගේ යැයි අද අපි කෙසේ නම් පිළිගනිමුද?

## වානර රූලකට හසුවූ මල්දමක්

සී. පී. කුලතිලක මහතාගේ ලිපියේ (1952 දෙසැ. 7 ලංකාදීප) තව කොටසක්...

"මේ සිද්ධිය සම්බන්ධයෙන් අපට ඇති මහා විශ්මය හා සැකය නම් මියගොස් වර්ෂ ගණනාවක් ගතව වියළී ගිය හස්තයකින් නම් ලියා පෙන්වා ඔය පෑවාය කියන මහා ප්‍රාතිහාර්ය ගැනවත් මදවත් විශ්වාසයක් නොකොට, එවැනි දිව්‍යමය වන්a, අත්භූත සාක්ෂිය ද අති තුච්ඡ මහා බොරුවක් නොහොත් තියුණු කපටි ප්‍රයෝගයක් කොට ඒ අසරණ සේවියර්තුමා අපෝස්තුලුවරයකු ලෙස එදා ඒ ගණන් නොගැනීම වේ. එංගලන්තයේ මහා ධර්මාධිකරණය ඉදිරිපිට ඔය සැටි මෘත හස්තයකින් මැරී වර්ෂ ගණනක් ගතවූ වියළී අතකින් නම් ලියා පෙන්වා යම් සාක්ෂියක් ඔප්පු කළහොත්, ඒ උතුම් ධර්මාධිකරණ මණ්ඩලය ඒ සාක්ෂිය කෙතරම් දිව්‍යමය සත්‍ය සාක්ෂියක් ලෙස එකහෙළා නොපිළිගනිත්ද? එහෙයින් එවැනි මහාශ්චර්යාද්භූත සාක්ෂියකින්වත් ඒ අත හිමි දේහය ඔය සේවියර්ගේ බවට පිළිගන්න බැරි වුණා නම් අපට එය පිළිගැනීමට ඇති යුතුකම කුමක්ද?

ඉන්පසු 3 වන වරටත් 1619 දී 14 වන ගිරිගෝරිස් පාප්තුමාගෙන් ද අපෝල්ස්තුවරයෙක් කරන ලෙස ඉල්ලා තිබේ. එතුමා ද ප්‍රතික්ෂේප කොට ඇත. කෙසේ හෝ වේවා මෙම සේවියර්තුමා මියගොස් වර්ෂ 68 ක් මේ වනවිට කල්ගතව ගියත් එතෙක් වාර කීපයක් මෙසේ ඉල්ලීම් කර තිබෙතත් ඒ සිටි පාප්වරු හා ශුද්ධ වූ සභාව ද මොහු ශුද්ධ වූ කෙනෙක් කියාවත්, තත් දේහය එතුමාගේය කියාවත් පිළිනොගත් බව ඉරහඳ මෙන් පැහැදිලිය.

අන්තිමට පසුකාලීනව 8 වැනි උර්බන් පාප්තුමාගෙන්ද ඉල්ලූවිට සේවියර් කෙරෙහි පැවැති පැරණි නපුරු වැරදි එතුමා නොදැන සිටීමෙන් 1622 දෙසැ. 6 වැනි දින මොහු අපොස්තලු සංඛ්‍යාවට පාප් වහන්සේ පිළිගෙන සන්නස දී තිබේ. ඒ සන්නස නම්" මේ ශ්‍රී සන්නසෙහි පූර්ව පිතුරු වූ ආබ්‍රහම් දෙවියන් වහන්සේ ගිවිස වදාල ආශිර්වාදය මේ අලුත් ඉන්දියානු අපොස්තුලුවරයාට ලැබුණු බවත් තම දරුවන් තරු හා වැලිවලටත් වඩා ක්‍රිස්තුත් ස්වාමි දරුවන් තුළ බෝවූ බවත් එතුමාගේ අපොස්තලු තානාන්තරය දිව්‍ය කැඳවීමක් බවට පිළිගත යුතු සාක්ෂි නම් අන් භාෂා කතා කිරීමද, දිවැස් වරම් ද, ආශ්චර්ය පෑමේ බලයද සුවිශේෂ බලය පූර්ණ වූ බවයි" යනුවෙනි.

මේ දැක්වූ සන්නසෙහි පෙනෙන ලෙස සේවියර්තුමා දිව්‍ය කැඳවීමට නොහොත් දෙවියන් විසින්ම ඔහු එම පදවියට තෝරාගෙන තිබෙන බවට පෙන්නුම් කොට තිබෙන සාක්ෂිවලින් එකක් නම්, මොහුට අන් භාෂාවලින් කතා කිරීමට තිබූ හැකියාවලු. එය එසේ නම් සිය බස හැර අන් භාෂා චතුර ලෙස කතා කළ හැකි තත් භාෂාවන්ගෙන් ග්‍රන්ථකරණයෙන් දක්ෂ බොහෝ උගතුන් අදත් ලෝකයේ අනන්තවත් ඉන්නා බැවින්, ඒ සියලු දෙනාම ඔය කියන දිව්‍ය කැඳවීම ලැබූවන් යැයි සිතිය හැකිද? මේ හැර කතෝලික පාදිලිවරු බොහෝ දෙනකු ඔවුන් වසන රටවල ව්‍යාප්තව ඇති තමන්ගේ නොවන භාෂා හොඳින් කතා කිරීමට ශක්තිය හැකිව සිටිත්. ඒ හැම දෙනාම දිව්‍ය කැඳවීමට අසුවූවන්ද? අනිත් සාක්ෂිය


දිවැස්වරම් ලැබීමලු. මතුවන දේ කියන මේ වරම ඇති මායා කාරවුන් කැඳවූවන් ලැබූවන්ද? තුන්වන සාක්ෂිය නම් ආශ්චර්ය පෑමේ බලයලු. එතුමාගේ වියළි අතින් තම නම ලියා පෙන්වූ බව අප අසා ඇත්තෙමු. නමුත් බොහෝ දින ගණන් ගැඹුරු පොළවෙහි වළලනු ලැබ සිට නැවත යහතින් නැගිටින, මාරක විෂ වර්ග පානය මාර නිරුපද්‍රිතව සිටින අය, තවත් විශ්මයජනක ක්‍රියා කිරීමට සමත් අය අද හැම රටකම සිටිත්. ඒ හැමදෙනාම ඔය කියන දිව්‍ය කැඳවීම ලැබූ අයද? සාවියර්ට තිබූ විශේෂ බලය කුමක්දැයි අපි නොදනිමු. නමුත් වැළඳී දොළොස් දිනකින් යමරජුට යටහත් වන්නට කරුණ වූ උණ රෝගයවත් ඔය පූර්ණව තිබුණාය කියන විශේෂ සුවිශේෂ බලයෙන් පමණක් නොව, ශුද්ධාත්මයේ මහිමයෙන්වත්. ත්‍රිත්වයේ ම අසහාය බලයෙන්වත් මැඬගන්නට අපොහොසත්ව අකාලයේ ඔහුට පරලොව ගන්නට සිදුවූ බව නම් අපි දනිමු." යුද්ධයට නැති කඩුව කොස් කොටන්නද?" කියමන මෙතැනට ගැළපේa.

එසේ මේ සිරුර එතුමාගේ ශුද්ධවූභාවය ප්‍රත්‍යක්ෂවීමට හේතුවක් නොවීමට, ලෝක ප්‍රකට රෝම සභාව හා ශුද්ධ වූ පාප් උතුමන් සිව්දෙනෙක්ම ඔය සිරුර සාවියර්තුමාගේ නොවන බවට ප්‍රබල සාක්ෂියකි. මේ සිරුර සාවියර්ගේම බව එදා පාප්වරු පිළිගත්තේ නම් සමහරවිට ඔය සිරුර අද තිබෙන්නට නිසිම තැන ශුද්ධ වූ ඔවැනි ධාතු ගොඩගසා ඇති හැම පාප්තුමාලටම නිත්‍ය වාසස්ථානය වූ වතිකානු මාලිගාව යැයි අපට සිතේ. ඔහු සිරුර ඊට වැද්ද නොගැනීමට එකම හේතුව එය "අශුද්ධ මිථ්‍යා දෘෂ්ටි කෙනකුගේ" ශරීරයක් බව නොවරදින සුලු දිවැස් නැතැයි කියන ඒ පාප්උතුමන් සිව්දෙනකුගේම එකාවන්" අදහස බැවින් නොවේද?

මෙසේ සිව්මහා ශුද්ධවන්ත පාප්උතුමන් හා තත් සභාව නොපිළිගත් සිය මාළිගයට වැද්දනොගෙන අත්හල සිරුරක් පොදු ලෝකයා කෙසේ පිළිගනීද? මෙම සන්නස නිකුත් කරන විට එතුමාගේ සිරුර ගෝවේ ජීවමානාකාරයෙන් බැබළෙමින් පැමිණෙන බව ශුද්ධ වූ සභාවේ උතුමන්ට හා පාප්තුමාටවත් නිසැකව දැනී තිබුණේ නම් එතුමාගේ දිව්‍ය කැඳවීමට පෑ අර නොපිරිමැහෙන නිසරු සාක්ෂි සමග එම සිරුර ද ප්‍රබල සාධකයක් ලෙසින් ලොකු අකුරින් ලියා නොසිටීද?

දැන් ඔය දේහය නැවත කවදාවත් නොපෙන්වන ප්‍රතිඥවෙන් භූමදාන කිරීමට සැරසෙනවාලු. මේ මළ සිරුර පළමුවෙන් ඉතා කෘෂර ලෙස වළලෑ අන්දම ඔවුන්ගේම මුවින් සඳහන් වී නැති එසේ වළලෑම සමාදානයේ සැතපීමක් දැයි අපි ප්‍රශ්න කරමු. ඒ අන්දමට මෘත දේහ තැන්පත් කිරීමක් ලෝකයේ ශීලාචාර කිසිවෙක් කිසි රටක නොකරන ඉතා අධර්මිෂ්ට අති තුච්ඡ, නොහොත් මෘත දේහයකට මිනිස් අතකින් කළ හැකි ඉතා අධම මෘග ක්‍රියාවක් පවා දැන් ගෝවේ සිටින දයාභරිත ශිෂ්ටසම්පන්න පූජා ප්‍රාසාදිවරු අතින් නොකැමෙත්තෙන්වත් කෙරෙත්ද? අනේ අපගේ ශ්‍රී රාහුල සංඝරාජයාණන්a වහන්සේගේ අසරණ ශ්‍රී දේහය වානර රැලකට අසුවූ මල්දමක් මෙන් නස්පැත්තියට ලක්වූ සැටි··"

## නොදිරන මෘතදේහය ගැන ගල් පැලෙන බොරු


ශාන්ත සේවියර් ජීවත්වූවා යෑයි කියන දේවස්ථානය

1505 දී පෘතුගීසීහු මෙරටට පැමිණි පසුව රජවරුන්ගේ අසමගිකම් ප්‍රයෝජනයට ගනිමින් ඉතා කෲර ලෙස ලක්දිව පාලනය කළහ. මේ අතරතුර අම්බන ප්‍රදේශයේ නරක් නොවී තිබෙන දේහය දැක ගම්වාසීන්ගේ විරෝධය ද නොතකා එම දේහය දොඩන්දූව වරායෙන් ගෝවේට ගෙන ගිය බව පැවසෙන පැරැණි ජන කවි දෙකක්ද අදටත් එම ප්‍රදේශයේ ජනතාව අතර පවතී. පෘතුගීසීහු ගෝවේ තිබෙන මෙම දේහය ශාන්ත සේවියර්ගේ යෑයි කියමින් ගෞරව දක්වති.

සේවියර් පියතුමා යනු පාප් වහන්සේ විසින් 15 වන සියවසෙහි ඈත නැගෙනහිර ආගම පතුරුවා හැරීම සඳහා පත්කළ නියෝජිතයාය. ඔහු චීනයට යන අතරමගදී "සැන්ක්ෂන්" නම් දූපතේදී මියගිය බව පැවසේ. ඔහුගේ සිරුර එහි වළලා සති කිහිපයකට පසු මලක්කාවට ගෙන යැමට නැවත ගොඩ ගන්නා විට සිරුර නරක් නොවී තිබෙනු දුටු බව කියති.

මෙම දේහය රහල් හිමිගේ යෑයි සිංහලයෝ පවසන අතර එය ශාන්ත සේවියර්ගේ යෑයි කිතුනුවෝ විශ්වාස කරති. මේ සම්බන්ධයෙන් නොයෙකුත් මතිමතාන්තර තර්ක විතර්ක ගෙනහැර පාති. මේ සම්බන්ධයෙන් වැඩිපුරම කතාබහ යෙදී ඇත්තේ පනස් වැනි දශකයේය. අද එම දේහයේ දකුණු අත නොමැත. එය රෝමයේ පාප් වහන්සේගේ ඉල්ලීමට කපා රෝමයට යැවූ බව කිතුනුවෝ පවසන අතර එම අතෙහි පෙර කී කවි දෙක කොටා තිබූ බැවින් එය රාහුල හිමිගේය යන්න තහවුරු වන නිසා අත කපා දමා ඇති බව සිංහලයෝ කියති. මේ සම්බන්ධයෙන් පැරැණි පුවත්පත්වල පළවූ ලිපි කිහිපයක් නැවත පෙන්වා දෙන අතර එම ලිපියේ ඉතිරි කොටස අද දැක්වේ.




1953/1/24 වැනි දින සිංහල බෞද්ධයා පුවත්පත 49 වැනි කලාපය. දෙවියන් සමඟ ගැවසී, කතාබස් කරමින් දෙවියන්ට ඉතා ප්‍රියව විසූ "මෝසෙස්" මුණිවරයා මෝවඩ් දේශයේ මළ විට, කෙනෙක් නොසිටියෙන් දෝ දෙවියන්ට ඒ මළ සිරුර ගෙන ගොස් රහස් ස්ථානයක වළලෑමට එතුමා තැතක් වෙහෙස ගත්තේ ඇයි? එදා ඒ සිරුර විනිශ්චය දවස තෙක් සාවියර් සිරුර මෙන්වත් පවත්නා ලෙස ආශිර්වාද නොකොට දිරාපත් වන ලෙස එය පස්

දමා යටකොට වදාළේ මක්නිසාද යැයි කියන්නේද? ඔය සිරුර මෙන් එය සුරක්ෂිත කොට වදාළේ නම් අද පාදිලිවරුන්ට ලෝ පුරා අහුමුලු ගානේ දුකසේ ඇවිදිමින් අන්දිටුවන් ඔය සමයට නතු කර ගැනීමට දබර සණ්ඩු කරමින් වාද විවාද උපදවමින් දුක් මහන්සි ගැනීමට සිදුවේද? මෙපමණක් නොව ඒ නිසා ලෝකයේ සිදුවූ බොහෝ දරුණු කුරුස යුද්ධාදිය කරණ කොට ගෙන ලක්ෂ සංඛ්‍යාත නිර්දොෂ අසරණ ලෝ වැස්සන්ට එසේ වීනම් රෞද්‍ර අකල් මරණ එකකුත් ඇතිවේද? ඒ මෝසෙස්ගේ සිරුර එසේ සුරක්ෂිත කොට තිබුණේ නම් ලෝක පතය මවන ලද දෙවියන්ගේ පළවන ගෝලයාගේ සිරුර මෙන්න යැයි කියා අද අපට පවා බලා සැක නැතිකොට ගෙන විවාද රහිතව ඒ ආගම පිළිගන්නට සිදු නොවෙත්ද?

හොඳයි එය ලොව මැවූ ළගදී කළ යුත්තක් වූ හෙයින් දෙවියන්ට ඒ නුපුරුදු කමින් අමතකව යන්නට ඇතැයි අප සිතුවත් ඉන්පසු ශුද්ධ වූ පාප් උතුමන් රාශියක් සිට මියගොස් තිබෙනුයෙන් එතැනින් ශුද්ධත්වයට පත් දවසට කිහිප වතාවක් දෙවියන් සමඟ පිළිසඳරෙහි යෙදෙන බැව් කියන නොවැරදෙන සුලු, දිව්‍ය බල මහිමයෙන් පරිපූර්ණ යැයි පතළ, පාප්තුමාගෙන් එකම කෙනකුගේවත් මළ සිරුරක් ආකශ්මිකව ශුද්ධ වූ සිරුරක් අද වනතුරු ඔය තත්ත්වයට ඒ දෙවියන් නොපත් කළේ බැරි නිසා නොවේ නම් මක් නිසාද? ඒ පාප්වරු සියල්ලන්ගේම මහෝත්තම භාවයට භක්තිමනත්වයට ලැබ සිටි දේව කරුණාවට, තපෝ ගුණ රාශියට වැඩි තරම්. ඒ හැම ලාභ නොයෙක් දොෂාරෝපණයට අසුව, සැකකටයුතු චරිතයක් ඇතිව සිටි, බොහෝ කාලයක් මහත් වෙර වෑයමකින් යම්තම් ශුද්ධ වූ කෙනෙක් හැටියට ඇතුළත් වූ එසේවත් ඔය සිරුර අශුද්ධ දේහයක් ලෙස යටි හිත්වලින් සලකා තවම වතිකන් මාලිගයට පවා වැද්ද නොගෙන තිබෙන ඔය සාවියර් පාදිලිතැනට ලැබී තිබුණු තත් සිරුර දෙවියෝ ඔය තත්ත්වයට පත්කොට වදාළෝ යැයි යම් කතෝලිකයෙක් කියතොත් එය මහා අපරාධ කීමක් බව අපට නම් සිතේ. එහෙයින් ඒ කීම ශුද්ධ වූ පාප් වහන්සේලාගේ මහෝත්තමභාවයට ගසන හෙණ පහරකි. නැතහොත් පාප්තුමාට කතෝලිකයකුට කළහැකි ඉතාම ලොකුම අපහසයකි. තවද පෝල් පාප්තුමාට එකල ගෝවේ සිටි මහා භක්තිමත් කතෝලික පූජා ප්‍රසාදීවරුන්ට ඔවුන් නිශ්චයෙන් තම මුණිවරයකුගේම බව දැන සිටි ඔය සිරුරෙහි ඇඟිල්ලක්, කනක්, කොනක් නොකපා දකුණු අත මුළුමනින්ම කපා යැවීම ගැන පමණක් සිතා බලන නුවණ මඳක් හෝ ඇති ඕනෑම කෙනකුට මෙහි සත්‍ය වැටහෙනු ඇත.

වර්ෂ තුන් හාර දහස් කල් සිට අද වනතුරු නොදිරා පවත්නා මිසර මෘතදේහ රාශිය පෙන්නුම් කරන්නෙමු. ඉන් ඉතා ප්‍රකට "තුනන් කාමන් දෙරණිසුරු" ගේ සිරුර විශේෂයෙන් සිහි කිරීම වටී. තවත් ඛබ්ලින් නුවර සාන්ත මිචාන් පල්ලියේ ඇති වර්ෂ 800 ක් තරම් පැරැණි සැරයන් කාලීන යුදභට සිරුර ගැන සිහි කරන්නෙමු. ඒ සිරුරෙහි ඇඟිලි හා නිය ඔය සාවියර් තැනගේය යන සිරුරෙහි මෙන් දිරා නොගොස් තවම හොඳින් පවතී. ඒ ළගම චීනයේ තිබෙන ෂුවංගේ මෘත දේහය මතක් කරමු. ඊට දැන් වර්ෂ 800 ක් තරම් ඇත. මේ සාධක අතුරෙන් සැරයන් සෙබළාගේ සිරුර හැර අන් සිරුරු සියල්ලම ක්‍රිස්තියානීන් කියන ලෙස මිසදිටු අයගේය. එසේ මිසදිටු සිරුරු හා මිනීමරුවකුගේ සිරුරකුත් ඔය සර්ව පරාක්‍රම දෙවියන් විසින් නොදිරා පවත්වන්නට වරම් දුන් සිරුර දැයි අප ඇසුවොත් ඊට කතෝලිකයන් දෙන පිළිතුර කුමක්ද? ලබ්ධි පටලයෙන් නුවණ සුමග නොවූ ඕනෑම කෙනකුට මළ

සිරුර නොදිරා පැවතියේ දෙවියන්ගේ වෙර වෑයමකින් නොවන බැව් වැටහේ. දේව බලයක් නොමැතිව මළ සිරුරු සුරක්ෂිත වීමට ඖෂධ ශක්තියම ප්‍රමාණවත් බැව් රුසියාවේ තිබෙන දශ වර්ෂයක් පමණ පැරැණි ලෙනින්තුමාගේම සිරුරෙන් පවා ප්‍රත්‍යක්ෂ වනවා ඇත.

දෙවියන් ඇස නොදුටු, එතුමාට පුළුටු දුම් රැල්ලකින් සතුටු සංග්‍රහයක් නොකලා, දෙවියන්ගේ මිනිසුන්ට වඩා බොහෝ අඩුපාඩු කම් ඇතිව සිටි තුනන් චෝදනා ලැබූ ඔය සාවියර් පාදිලිතැන වැනි "සෙස්සන්" ගේ මෘතදේහ කිහිපයක් සමහර විට ඔය දෙවියන් විසින් මහත් ඕනෑකමින් ආශීර්වාද දානය කොට මතු පස්වා දහසක් කල් නොදිරා ජීවමානාකාරයෙන් පවත්නට වරම්දී තිබේලු. මේවා නොවෙද ගල් පැළෙන බොරු" සර්ව සාධාරණ උතුම් දෙවියන් එතරම් අයුත්තක් කිසි විට නොකරන බව හැමදෙනාටම අවබෝධ වන කරුණකි. මෙය තවත් පැහැදිලි කරමු. මෝසස්, නෝවා, ලොත්, ඒබ්‍රහම්, සුජනා ආදී දෙවියන් විසින් තෝරා ගනු ලැබූ සුවච උපස්ථායකයන් නොහොත් දෙවියන් විසින් නොයෙක් වාරවල බොහෝ ආශීර්වාද පවා කරන ලද, දෙවියන්ට කඳු උඩට මස් හා පුළුටු දුම්, සැර මත්පැන් පමණක් නොව ඇතිව සිටි එකම දුව හා කන්‍යාවන් පවා පුදන ලද මහා භක්තිමත් ප්‍රියංකර සහචරයන්ගෙන් එක හාදයකුගේ සිරුරක් වත් මතු ස්ව සමයවාදීනට බලා සතුටුව භක්තිය තරකොට ගැනීම පිණිසවත් උපකාරී වන ආශීර්වාද කොට නොතබා අප දෙපක්ෂයට මතභේද ඇතිකොට ගෙන වාග් සටනකට දැන් යොමුවීමට පමණක් හේතුවූ අන් කිසි පලක් නොවන සාවියර් නම් මේ පාදිලිතුමාගේ මළ සිරුරට පමණක් විනිශ්චය දින තෙක් නොදිරා පවත්නට සර්වබල වරම් දුන් කාරණය නම් ලොව නුහුලන මහා අපරාධයකි.

## එය එම්බාම් කරන ලද සිරුරකි



මා විසින් මෙම විෂය සම්බන්ධයෙන් පනස්වන දශකයේ පළවූ ලිපි එලෙසින්ම පළ කළේ එකල භාවිත කළ භාෂා ශෛලීය සහ මේ සම්බන්ධයෙන් විද්වතුන් තුළ තිබූ උනන්දුවද හුවාදක්වනු පිණිසයි. නමුත් තම මතය තහවුරු කිරීම සඳහා "දෙවියන්" පිළිබඳව සමහර තැන්හි සඳහන් කර ඇති දෑ කතෝලික බැතිමතුන්ගේ නොසතුටට සහ චිත්ත සන්තාපයට හේතුවීමට ඉඩ ඇති බැවින් මින් පසුව එම ලිපිවල එම කොටස් අත්හැර කරුණු පමණක් හැකිතාක් දුරට සඳහන් කරන බවද දන්වා සිටිමි.

(1953 පෙබරවාරි මස සිංහල බෞද්ධයා - පුරාවෘත විශේෂඥ එස්. කුලතිලක විසින් පළ කළ ලිපියේ ඉතිරි කොටස මෙසේය)

"රෝමයේ තිබෙන සුරක්ෂිත මළ සිරුරු හා සාවියර්තුමාගේ සිරුර හුදු දේව බලයෙන් බව ලෝවැස්සන්ට නිශ්චයෙන් පිළිගැනීමට සුවඳක් විහිදුවීම වැනි විශේෂ යමක් එහි තිබේද? නැත. "ඇන්ටෝනියෝ වුල්ෂ් ගැන්ගෝද සිල්වා" නමැති කතෝලික මහා වෛද්‍යවරයා පවා තීන්දු කර ඇත්තේ මෙය "එම්බාම් කරන ලද ශරීරයක්" වශයෙනි. එබැවින් සාවියර් සිරුර මෙන් මිසර අවධියෙන් මෙහා පවතින සිරුරු සියල්ල දේව බලයෙන් නොව බෙහෙත් සංයෝග බලයෙන් සුරක්ෂිත කළ මළ සිරුරු බව සනාථ වේ. එම මතය බොරු කිරීමට නම් මිසර කාලයෙන් එහා සිටි දෙවියන් විසින් නොදිරා තිබීමට ආශිර්වාද කළ දේව භක්තිකයකුගේ සිරුරක් තිබෙන තැනක් ලෝකයාට පෙන්විය යුතුයි....

"දැනට මෙසේ ලොව ඇති තාක් පල්ලිවල තිබෙන සේවියර්ගේ බඳු සිරුරු රෝමානු කතෝලිකයන්ගේ වේ. නමුත් කැන්ටබරියේ අග්‍ර බිෂොප්තුමා ආදීන් ඇතුළු අන්‍ය නිකායවල ක්‍රිස්තියානින්ට දෙවියන් වහන්සේගේ එම ආශිර්වාදය ලැබී නැත. මන්ද එම අන්‍ය නිකායන්හි පල්ලි එකකවත් ඒ ආකාරයේ සිරුරු නැති බැවිනි...

"ක්‍රම ක්‍රමයෙන් ලෝකයෙහි ප්‍රඥවන්තයන් බිහිවී ඖෂධ සංයෝගානුසාරයෙන් මළ සිරුරු නරක් නොවී දීර්ඝ කාලයක් තබාගැනීමට පුළුවන් ක්‍රම දැන සිටි බැව් මිසර "මමීස්" නම් සුරක්ෂිත කරන ලද මළ සිරුරුවලින් පවා සනාථ වේ. මෙලෙස ඖෂධ කවා සුරක්ෂිත කරන ලද එම මෘතදේහ ඒ තිබූ තැන්වලින් රහසින් ගෙන තම අදහස්වලට ගැලපෙන අයුරින් වෙනස්කොට ස්වලබ්ධිකයන්ගේ අන්ධ භක්තිය වඩාත් තහවුරු කරනුවස් පෙන්වමින්, මහෝත්තම දෙවියන් විසින් විනිශ්චය දවස එනතුරු නොදිරා ආශිර්වාද කොට දෙවා වදාරන ලදැයි කියමින් රෝමානු කතෝලික පල්ලිවල තබා ඇත. සත්‍ය මෙය නොවේ නම් එංගලන්ත සභා ආදී වෙනත් ක්‍රිස්තියානි නිකායයෙහි එක පල්ලියකවත් එවන්

සිරුරු නැත්තේ ඇයි...?

"බෞද්ධ අප තුළ මේ පිළිබඳව තවත් සැකයක් ඇත. එනම් කතෝලික හැම පූජා ප්‍රසාදිවරයන්ගේ සිරුරේ කොටසක් මෙන් බෙල්ලේ හෝ ඉනේ ශුද්ධ වූ ලොකු කුරුසියක් තිබෙන මුත් මෙම සිරුර මත එවැන්නක් නොමැත්තේ ඇයි යන කරුණයි...

"සෑම කතෝලික පාදිලිවරුන්ගේම මෘත දේහ තබාලන ආගමානුකූල සිරිත නම් දෙවියන් බලන සේ මුහුණ උඩට හරවා සිරුර උඩුබැල්මෙන් සතපා තිබීමයි. නමුත් මේ සිරුර තිබෙන්නේ වම්පසට ඇලවය. අතද සිරුරෙන් ඈතට විසිවී ඇත. තිබෙන එකම අතවත් මළ විගස පපුව මත තබා නැත. කුරුසියද අතින් ගෙන නැත. උඩුබැල්මෙන් සතපාද නැත....

"රාහුල සඟරජතුමා යම් රෝගයක් වැළඳ නොමළ බවත් ආයුක්‍ෂය හේතුවෙන්ම අපවත් වූ බවත් කියමු. එතුමා මෙලොව හැර යන මොහොත පවා ආයුර්දය ක්‍රමයෙන් දැන සිටි සේක. ඒ දින තුන හතරකට පෙර චාරිත්‍ර අනුව හිස රැවුල් බා අගනා සිවුරක් පොරවාගෙන සිට ඉන් මඳ වෙලාවකට ප්‍රථම ඒ තිබූ "ගල් දෝලාවේ"හි දකුණු අත නමා හිසට තබාගෙන වම් හස්තය සිරි දේහය මත තබා අනගාරික උතුමෙක් සැතපෙන පුරුදු ලීලාවෙන් අන්තිම ශෙයාාවෙන් එහි සැතපී වදාරන්නට ඇත. ප්‍රාණය නිරුද්ධ වූ ඉක්බිති කලින් එතුමා සකස් කරවා තබා තිබූ සුගන්ධ තෛලය දෙන පුරා වත් කර, පියන වසන්නට කෙනකුට විධාන කොට තිබූ බව පරම්පරාගතව එන කතාවලින් පෙනේ. එහි එසේ රහස්ව තිබූ ඒ සිරුර අර්ධ ශතවර්ෂයක් නරක් නොවී තිබූ පසු ඔය සාවියර් පාදිලිතුමාට ලැබෙන්නට ඇත. එතුමා එම සිරුරගෙන යන්නට ඇත්තේ මේ පසුව ඇති වන විප්ලවය ගැන අදහස් දැන යැයි නොසිතමු. එහෙත් මිසරවාසීන්ට වඩා ලක්වැසියන්ට අද්භූත අන්දමින් මෘත දේහය සුරක්ෂිත කිරීම පුළුවන් බව තම වර්ගයාට හෝ ආගමික උසස් අයට හෝ පෙන්වීමට ගෙනගොස් තබා චීන, ජපන් ආදී රටවල් කරා ගොස් ආපසු එන අතරේ නැවේදී මියගොස් තිබේ. සිරුර ගෝවේට ගෙන එන විට හොඳ හැටි දරදඬුව කාලයක් ගතව ඉවර නිසා සාවියර් නම් හිතවතාගේ මෘත දේහය මේ යැයි කියා ලොවට ප්‍රකාශ කිරීමට ප්‍රථමයෙන්ම අදහස් කළ ඒ සාවියර් තුමාට බොහෝ ලැදිව සිටි පූජකවරයකු ඒ සිරුරෙහි නමා හිසට තබා තිබූ දකුණු අත එවිට මුලින් නොකපා නම් ඒ තිබූ ඉරියව්ව වසාලන්නට ක්‍රමයක් නැති බව පෙනුනෙන්ද, එසේම අප පෙර දැක්වූ පරිදි කවි කොටවා තිබූ නිසාත්, ඒ "කරදර" අත මුලින්ම කපා සඟවා සිට කාලයකට පසුව රෝමයේ පෝල් පාප්තුමා හට වැලමිටින් එහා කොටස යවා අකුරු කොටා තිබූ කොටස විනාශ කළ බව අපේ අදහසයි.

ඉතිරි වමත වත් පාදිලි සිරිතට අනුව පපුව උඩ තබාලීමට පවා (දරදඬුකමින්) බැරිව, වෙන කරන්නට දෙයක් නැති නිසාම මොනම සිරිතකටවත් නැති අන්දමට ඒ අත ඔය දැන් තිබෙන ලෙස දේහයෙන් මඳක් ඈත් කොට හදිසියෙන් ලත් මාරක පහරකින් මැරී වැටුණු කෙනකුගේ සිරුරක් මෙන් දැන් ඔය තබා ඇති අව පිළිවෙළට තැබීමට සිදුවූ බව පෙනේ. ඒ වම් අතේ එවිට ගල්වී තිබූ ඇඟිලි අස්සේවත් පුරුදු කුරුසිය රඳවා පෙනෙන්නට වත් තබන්නට බැරි වී ඇත. කෙසේ වෙතත් ඒ බැරිවීම ගැන අපි වැඩි අකමැත්තක් නැති බව කියමු."

## සිරුර දේව බලයෙන් සුරක්ෂිත නැත



බවුරින් බිෂොප්තුමා බොම්බායේ කතෝලික ඇග්සැමිනර් පත්‍රයට ලියා එවා ටයිම්ස් පත්‍රයේ පළ කර තිබූ කරුණු සංක්ෂිප්තව මෙසේය.

"ගෝවේ අග්‍ර බිෂොප්තුමාගේ ඉල්ලීම පිට යාපනේ බොන්ජියන් බිෂොප්තුමාත් හයිද්‍රබාඩ් පළාතේ බිෂොප්තුමාත්, මද්‍රාසියේ විහාරි ජනරාල් තැනත් දේවගැතිවරුන් ගණනකුත් කැටුව (වර්ෂ 1878) නොවැ. 29 වැනි දින බොම්බායෙන් පිටත් වී ඊට පසුවදා ගෝවේට පැමිණුනෙමු. සාවියර් ශුද්ධවන්තයාගේ ශරීරය පිළිබඳව පවත්වන ලද "මාහැඟි" මෙහෙය පෙරහැරවල අපි දුටුවෙමු. ශුද්ධවන්තයාගේ ශරීරය වසා තිබූ වැස්ම හැර දහස් ගණන් දෙනාට පෙන්වන අතර හිසත්, අත්, පාදත් දෙස බොහෝ වේලා බලා සිටියෙමු. මක්නිසාද ඒ අවයව පමණක් වසා නොතිබූ බැවිනි. අනෙක් තැනැත්තෝ මීට අවුරුදු 300 කට පමණ පෙර එතුමාගේ ශරීරය බැලුවාක් මෙන් අප ද එතුමා දෙස බලමින් සිටින අතර කෝටි ගණන් ආත්මවල ගැලවීම පිණිස දෙවියන් වහන්සේ විසින් තෝරාගත් ඒ උතුම් වූ ශුද්ධ වූ ආත්මයේ කූඩාරම මේ යැයි හැඟී සමාදානයේ ශුභාරංචිය දේශනා කළ එතුමාගේ පාද ඉතා ගෞරවයෙන් සිප ගත්තෙමු. ඊට පසු දවසේදීත් අග්‍ර බිෂොප්තුමා අප කැඳවාගෙන ගොස් ශරීරය හඳකාර පරීක්ෂා කර බලන්ටත් යාච්ඤා ඔප්පු කරන්ටත් ඉඩ ප්‍රස්ථා ලබා දුන්නේය. ශරීරයේ දකුණු පාදය ඔසවා බලන්ට මට අවසර ලැබුණේය. විළුඹත්, යටි පතුලත්, ඇඟිලිවල නියපොතුත්, නහර යනාදියත් තදව ඇකිළී දුඹුරු පාටට හුරුව තිබුණ නමුත් සම්පූර්ණ පිළිවෙළට හොඳාකාරයෙන් ප්‍රවේශම්ව තිබුණි. වම් පාදය මඳක් තුවාල වී තිබුණි. දෙවැනි ඇඟිල්ල කැඩී එල්ලී තිබුණේය. කුඩා ඇඟිලි තුනක් නොමැත. විළුඹේ හම සමහර තැන්වල දිරාගොස් තිබුණු නමුත් ඉතා සවිය ඇති හම් වාගේ සවි ලෙස එකට බැඳී තිබුණේය. ඇස් සම්පූර්ණයෙන්ම වළ නොගැසී තිබුණා පමණක් නොව ශරීරය පරීක්ෂා කළ වෛද්‍යාචාර්යවරයා කී ලෙස යටිබඩත් එසේමය. දකුණු කම්මුලත් නාසයේ අගත් තුවාල වූවා සේ පෙනුණි. වම් හස්තයේ හමට යටින් තිබෙන නහරත්, ඇඟිලි සහ නියපොතුත් සම්පූර්ණ ලෙස ආරක්ෂා වී තිබුණි. තවද කිසි තැනක කුණු වී ගිය ලකුණක් නැත." ආදී වශයෙනි.

මේ සම්බන්ධයෙන් සී. ජී. කුලතිලක මහතා දැක්වූ අදහස් පහත සඳහන් පරිදි වේ. (1953 මාර්තු 28 සිංහල බෞද්ධයා)

"එසේ නම් මෙම බිෂොප්තුමා ද පැහැදිලිව දැක බලා කියා ඇති පරිදි මෙම සිරුර දිරා යමින් පවතී. එබැවින් සර්වබල දෙවියන් වහන්සේ විසින් දිවැස් කරුණා මහිම නාමයෙන් පස්වා දහස් කාලයකට ඉර හඳ පවත්නා තුරු නොදිරා පවත්වන්ට සර්ව බල වරම් ආශීර්වාද පුරවා සුරක්ෂිත කොට වදාළ බවට

තර්ක කරන මෙම සිරුර වසර 400 ක් ගෙවන්ට මත්තෙන් ක්‍රම ක්‍රමයෙන් දිරා යැමට පටන් ගෙන ඇත්නම් මෙය දිව්‍යමය කටයුත්තක් සේ සැලකීම තුළින් සර්වබල දෙවියන් වහන්සේට තදබල නින්දාවක් ඇතිවූවා නේද? එය එසේ නොව බෙහෙත් බලයෙන් කරන ලද්දක් බව දැන්වත් අපේ කතෝලික හිතවතුන් පිළිගන්නේ නම් දෙවියන් වහන්සේට වන නින්දාව වළක්වාගත හැකි නොවේද?

දෙවියන් වහන්සේ නිත්‍ය නම් උන්වහන්සේගේ සකලවිධ කෘත්‍යයක්ම එසේම නිත්‍ය විය යුතු නොවේද? ඉතින් මේ සිරුර අපි ඉහතින් පෙන්වා දුන් ලෙස දැන් අනිත්‍ය බවට දෙස් දෙමින් ශීඝ්‍රව දිරායමින් තිබේ. එසේනම් දේව මැවිලිවල අනෙක් හැමදේමත් එලෙසම අනිත්‍ය බව සත්‍ය නොවේද? එවිට බුදුදහමේ උගන්වන ඔය අනිත්‍ය සිරුර සුරක්ෂිත කළ දෙවියන් පවා අනිත්‍ය කෙනෙක් මිස සදාකාලික නිත්‍ය, වෙනස් නොවන කෙනෙක් විය නොහේ.

ඖෂධ ශක්තියකින් සීමා සහිත කාලයක් කුණු නොවී පවත්වන්නට සලසා තිබූ සිරුරක් සිය දේව හාස්කමක් ලෙස තම දෙවියන් මත පැටවීමට යැමෙන් තමාගේම ආගමික නායක දෙවියන් වහන්සේට ඔවුන්ම කර ඇති මදි පුංචිකම නිග්‍රහය සුළුපටු නොවේ. ඒවාගේම මෙම මෘත දේහය දෙවියන්ගේ ආශිර්වාදය ලැබූවක් ලෙස සිතන විට එය දෙවියන් සතු වස්තුවක් වෙත්. එසේ නම් එහි කොටස් සිඳ බිඳ ලෑම බරපතළ දේව අපරාධයකි. මනුෂ්‍ය අතකින් නොකළ යුත්තකි. එමෙන් හිතුමතේට ඉන් කැබලි කපා තැන තැන යැව්වාය. කියා සඟවා ගෙන සිටීමත් දෙවියන් සතු දෑ සොරකම් කිරීමත් අපරාධයක් වන අතර මළවුන්ට කරන අධම ක්‍රියාවක් ද වේ."

1952 ඔක් 27 වැනි දින ඔබ්සර්වර් පත්‍රයේ කතෝලික පාර්ශ්වයෙන A සිරුරේ වර්තමාන ස්වභාවය ගැන කියා ඇත්තේ එම සිරුර විවෘත ස්වභාවයෙන් තිබීම නිසාත්, වන්දනාකරුවන්ගේ හිරිහැර නිසාත් ඒ දේ සිදුවී ඇති බවයි. භක්තිවන්ත (මෝඩ) ස්ත්‍රී පුරුෂයෝ එහි පාද සිඹීමෙන් පා ඇඟිලිවලට විපත් සිදු විය හැකි වුවත් නහය එබී අග කැඩී ඇත්තේ මුහුණ සිඹීමෙන්ද? එහි හිස, අත්, පා අළුපාට ගැනුණේ දුම් වැදීමෙන්ද? හිස් කබලෙහි හම කැඩී ගැලවී දැන් ඇතුල් කට්ට පෙනෙමින් හිස දිරා ගියේත් මුළු සිරුරෙහි ඇට දිරූ දර කෝටු මෙන් කැඩෙන්නේ මක් නිසාද? වියතක් පමණ දිගට සාවිs යර්තුමා ආදරයෙන් වවාගෙන සිටි කදිම ස්පාඤ්ඤ රැවුල් බිස්ස හා අගල් කිහිපයක් දිගට වවා නිතර පීරා සිටි හිසකෙස් දැන් එකකුත් නැතිව වැටී ශ්‍රමණ මුහුණක් මෙන් හිස හා මුහුණ මුඩුව, ඒ හිලව්වට මෙන් නූලක් දෙකක් දික් කෙස් රැවුල් කෙඳි ඇත්තේ කෙසේද? යමක් විවෘත ස්වභාවයෙන් තැබීමෙන් වන වරද, ඊට සූර්යය රශ්මිය හා සුළං වැදීම යැයි සිතමු නම් ඒ සියල්ල දත් සර්වබල දෙවි කෙනෙක් ඔය සිරුර අසීමිත කාලයක් නොදිරා පවත්වන්නට සුරක්ෂිත කර ලන්නට ඇත්තේ එතරම් සුළු කරුණක් පවා උන්වහන්සේ නොදැන සිටි නිසාද? අවු සුළංවලට ඔරොත්තු නොදී දැන් ඔය සිරුර දිරා යා නම් එහි ඇතැයි කියන ඔජවඩන ශුද්ධ භාවය/ දේව බල මහිමය කුමක්ද? අව් සුළඟට සිදුවන විකෘති ලොව ඇති අනේක දේව නිර්මාණවලටද සාධාරණ බැවින්ම, කඳු පර්වතාදිය ලෝකාන්තය තෙක් පවත්නා සේ ඔය දේව දස්කම එසේ නොවන්නට විශේෂ හේතුව කිම? අසීමිත කාලයක් නොදිරා ජීවමානාකාරයෙන් ඔය සිරුර පවත්නට දෙවියන් විසින්ම ඇතිතාක් සර්වබල මහිමාශීර්වාද ගන්වා සුරක්ෂිත කරන ලදැයි කියන්නේ අව් සුළංවලට නොපෙන්වා ඊට හිස නමා ආවරණය කොට එය

තබන්නනම් මේ හැටි අමාරුවෙන්/ අවධානමින් කුමට සුරක්ෂිත කළෝද?

එසේම එම දෙවියෝම ඊට එවේලේම වීදුරු/ ලෝහ පෙට්ටියක් නැතහොත් විනිවිද පෙනෙන පිට සිවියක් මෙන් යමක් මවා ඒ තුළ ඔය සිරුර නොතිබ්බේ ඇයි? ඉතිරි වැඩ නරයන්ගෙන් කරනු පිණිසද? අව් සුළං නොවැදීමට විශේෂයෙන් දෙවියන් විසින් ඔය සිරුර සැකසුවා නම් ඊට යෝග්‍ය ලෙස ඒ රහස දැන එය රැක ගැන්මට ඒ සිටි පූජකවරුන්ට ක්‍රමයක් නොතිබුණාද? නොඑසේ නම් ඔවුන් පවා එය දැන සිටියේ නම් ඒ අපවත් පිළිවෙළට එය එළියේ තබා සිටියේ එය බැතිමතුන්ට පෙන්වා මුදල් රැස් කිරීමට නොවේ නම් අව් සුළං ලවා සිරුර ස්වල්ප කාලයකින් නැති භංග කිරීමටද? හුළං නොවදින ලෙස මාළු මස් වර්ග ටින්වල අසුරා තබන ලෙස ඔය සිරුර වසා ලීමෙන් පමණක් නොදිරා පවත්නේ නම් දේව ශක්තිවල වගක් ඊට කුමට ගාවන්නේද? මේ සියලුදෙයින් පෙනෙන්නේ මෙම සිරුර දේව බලයකින් සුරක්ෂිත වූවක් නොවන බවයි. තවදුරටත් එය එසේම යැයි කතෝලිකයන් පවසන්නේ නම් ඔවුන් තමන්ගේම දෙවියන් වහන්සේගේ බල පරාක්‍රමය ඉන් හැල්ලුවට ලක් කරනු නොවේද?

## මෙවැනි බොරු කීම දෙවියන්ට අගෞරවයකි



මෙහි සඳහන් වන්නේ කුලතිලක මහතාගේ ලිපි පෙළෙහි අවසාන කොටසය. (බුද්ධ වර්ෂ 2496 බක්මස අව දොළොස්වක් ශනි දින, සිංහල බෞද්ධයා පුවත්පත)

මෙම සිරුර දැන් දිරාපත් වන්නේ අව්, සුළංවලට මුහුණ දීමෙන් යැයිද ඒ නිසා මෙම සිරුර වීදුරු පෙට්ටියක තබා ආරක්‍ෂා කරතැයි යන්න අපගේ කතෝලික මිත්‍රවරුන් පවසයි. සාවියර්තුමා මළ විගස දෙවියන් විසින් ඒ සිරුර තම බලයෙන් රක්‍ෂා කරමින් අව් සුළං ඊට වහ කදුරු වැනි අපත්‍ය අගුණ බව එසේ නම් නොකීවේ/ දැන ගැනීමට නොතිබ්බේ ඇයි? රෝගියකුට බෙහෙතක් පොවා, ඇල් පැන් පානය කළහොත් ක්ෂණයකින් මියයන බව ඒ වෛද්‍යවරයා දැන දැනම ඒ බව රෝගියාටවත් ඔහුගේ හිතවතෙකුටවත් නොකියා සිට ඒ හේතුවෙන්ම රෝගියා නැසී ගියහොත් රෝගියාගේ මරණයට ඒ වෛද්‍යවරයා කතෘ නොවන්නේද? මේ වාගේ බොරු කාරණා කීමෙන් අප්‍රසාදයට පත්වන්නේ තමන්ගේම ආගමික ශාස්තෘවරයාණන් වහන්සේම නේද?

සීමා රහිත දෙවියෙක් එසේම අසීමිත කාලයක් නොදිරා දෙව් බල මහිම පෑමට සුරක්ෂිත කළැයි කියන ඔය සිරුර එතුමා විසින්ම මාවාලූ හුළං පොදක් වැදීමෙන් අව් රශ්මියෙන්, දිරා පිච්චී ගියැයි කීම නියම කතෝලික බැතිවරුන්ට නම් විහිළුවකි. විවෘතව තිබීමෙන් වායෝ, තෝජෝ, ධාතුද්වයේ ගුණ ගැන ඒ සිරුරට ස්පර්ශ වීම හේතුවෙන් දේව කැමැත්තක්/ අධිෂ්ඨානයක් විනාශ වෙත්නම් ලෝකයේ ඇති ධාතුවල ලෝකය මැවූ සර්වබලකාරයාගේ සකල බලම මැඬලීමෙහි, අබලන් කිරීමෙහි, සමර්ථ ඊට වඩා ශක්තියක් එකී ධාතුබලවලට ඇති රඟ මොනවට ලොවට ප්‍රත්‍යක්ෂ නොවේද? දේවබල පරද්දා ලෝක ධාතු බල රජකරන බව එසේ නම් කතෝලික ධර්මධරයන් පිළිගන්නවාද? සියලු බල යුත් දෙව් කෙනෙකුට වුවමනා නම් ඔය සිරුරම මහා මඩ වගුරක ඔබා තිබුවත්, අග්නි ජාලාවකට මැදිකොට තිබුවත්, කෙසඟක පමණ වෙනසක්, විකෘතියක් නොවන ලෙස පවත්නට සුරක්ෂිත කරලීම එතුමා හිතු පමණින් කළ හැකිවන ඉතා සුළු වැඩක් බව හිතා ගන්නටවත් බැරි මිනිස්සු බත් කන්නේ පුරුද්දට විය යුතුයි.

කිසිම දෙවියකුගේ සම්බන්ධයක් නැතිව වර්ෂ හාර පන්සියයක් නොව තිස් ලක්‍ෂයක් නොදිරා තිබී ගොඩගත් එක් සත්ත්වයකුගේ සිරුරක් ගැන "පිල්ඩැල්පියා, රකෝඩ්" නම් පත්‍රයෙහි පුවතක් අපි මෙහි දක්වන්නෙමු. මේ සත්ත්වයාගේ උස අඩි 18 කි. දත් 5000 කි. මේ සත්ත්ව සිරුර සොයාගෙන තිබෙන්නේ චාර්ල්ස් එච්. ස්ටර්න් බර්ත් නම් පෘථිවි ගර්භාත්කරගත ද්‍රව්‍ය පරීක්‍ෂා කිරීමෙහි නියුක්තව සිටි ශාස්ත්‍රඥ මහතා ඇතුළු පිරිසකටයි. ඇමරිකන් කෞතුකාගාරයේ මේ සිරුර අදටත් තිබේ. වර්ෂ 1909 දී එහි ප්‍රධාන ධුරය උසුලා සිටි ආචාර්ය ඔස්බෝර්න් මහතා මේ සත්වයා ගැන කියා ඇත්තේ 1909 දී පොළොවෙහි ගල් තට්ටුවක් හාරාගෙන යන විට පාත්තයකුගේ හොටක ආකාර විශාල හොටක් හා ඇත් බඳක් තරම් මහා ශරීරයක් ඇති සත්වයකුගේ මෘත ශරීරයක් ඔවුන්ට සම්භ වූ බවත්, උගේ සම් මස් නහර කිසිවක් කුණු නොවී වියළී වැලි භූමියක මැරී අධික සූර්යතාපයෙන් කුණුනොව ඇට සම් මස් නහර කිසිම දෙයක් කුණු නොවී සුරක්ෂිතව තිබූ බවත්. මේ වර්ගයේ සත්ත්වයන් වාසය කොට තිබෙන්නේ නිව් ජර්සි, මිසිසිපි, ඇලඩාම්, යෝමං, මොංටැනා, ඩැකෝටස් යන රටවල බවත්ය. කතෝලික මිතුරනි, මේ දැන් අපි ඔබ තුමන්ලාට පෙන්වා දුන් ප්‍රවෘත්තිය අනුව සර්වබල යුත් මහා දෙවියකු විසින් මිත්‍යාදෘෂ්ටීන්ගේ පවා ආත්ම නැලවිල්ල සඳහා ඉර හඳ පවත්නාතුරු මහා අපූරුවක් ලෙස ලොව කොතැනකවත් නැති අරුම වස්තුවක් ලෙස නොදිරා පවත්නට බොහෝ ඕනෑකමින් ආශිර්වාද කොට සුරක්ෂිත කරන ලද සාවියර් මුනිවරයාගේ ආත්ම කූඩාරම, විශේෂ උගත් පූජක කිහිප දෙනෙක් විසින් රෑ දවල් දුක් මහන්සි ගෙන හුලං නොවදින වීදුරු පෙට්ටියක ලා පාට ඇතිරිලි මතුයෙහි පරෙස්සමින් පොරවා රැකබලා ගෙන සිටලත් වර්ෂ හාරසීයක් ඉක්මවන්නටත් පෙර එහි මස් කොටස පිටිමෙන් දිරා ගිය මුත් පොළොවේ ඉතා ගැඹුරු පස් යට මේ තිරිසන් සිරුර කිසි නිලධාරියකුගේ පිළිසරණ මාත්‍රයක් නැතිව වර්ෂ තිස් ලක්‍ෂයක් ධාතු ගුණ සංසර්ගයෙන් පමණත් තවමත් මස් පමණකුදු කුණු නොව තිබීම කතෝලිකයන්ගේ පමණක් නොව ක්‍රිස්තියානි යැයි කියන සෑම අයගේම මැවුම්කාරයාට පා පහරක් දීමක් මෙන් නින්දා ගෙනදෙන කාරණයක් නොවේද? තවත් එම සත්වයාගේ මස් කුණු නොවී පැවැත්මට විශේෂයෙන් හේතු වූ බව කියා ඇත්තේ ඔය දේව සුරක්ෂිත සිරුරට විෂ වූවා යැයි කියන සූර්ය රශ්මි ස්වල්පයක් නොව අධික සූර්ය තාපයලු. යුදෙව් හෙවත් ක්‍රිස්තියානි දෙවියන්ගේ දේව දුර්වලකමක තරම. ඔවුන්ගේම මහා විද්‍යාඥයෙකුගේම මේ ප්‍රකාශයෙන් ප්‍රත්‍යක්‍ෂ වන අයුරු පෙනේද?

එසේම බර්ලින් සමස්ත ශාස්ත්‍ර ශාලාව සම්බන්ධ ප්‍රථිවිගර්භ විද්‍යාලයේ ආචාර්ය හැන්ස්රෙක් නම් ජර්මන් පඬිතුමාට ජර්මනියට අයත් නැගෙහිර අප්‍රිකාවේ උතුරු පෙදෙසෙහි පොළොව යට තිබී මනුෂ්‍ය ඇටසැකිල්ලක් සම්බ වී තිබේ. එය අවුරුදු 150, 900 ක් පරණ එකකැයි එතුමා පරීක්‍ෂා කර කියා තිබේ. මේ අය විලක ගිලී මළ බව අනුමාන කටයුතු බවත් මළකඳ වළ පතුලට වූවිට ක්‍රම ක්‍රමයෙන් වතුර සමඟ ආවැලි පස් හා රට හුණුද ඒ මත වැටී ඉන් වැසී ගොස් කල්යැමෙන් ඒ වැලි හුණු හයිවී ඒ මැද ඇටසැකිල්ල සුරක්ෂිතව තිබුණු බවත් සිතා තිබේ. මේ සිරුර ගැන තවත් සැලකිය යුත්තක් නම් මොවුන් ජීවත්ව සිටි බව කියා ඇත්තේ වෙන මැවුම්කාරයකු මවා ඇති ලෝකයක බවයි. බයිබල් දෙවියා මේ ලෝකය මවා තිබෙන්නේ වර්ෂ හයදාහකට බොහෝ මෑතය. මොවුන් සිට ඇත්තේ වර්ෂ එක් ලක්‍ෂ පනස් දහසකට පෙරය. එතෙක් කල් පෘථිවි ගර්භයේ කිසිම බාහිර ආධාරයක් නැතිව වැළලී පැවති මේ මිනිස් ඇටසැකිල්ලෙහි ඇට කටු, දත් ඔය ශාස්ත්‍රඥ පූර්ණ ප්‍රසාදීවරු බොහෝ දෙනෙක් දිවා රෑ ආරක්‍ෂා

කළ සිරුරෙහි ඇට කටු තරම් තවම දිරා ගොස් නැති බව පුදුමයකැයි නොසිතිය යුතුයි. මහා භූත ශක්තියෙන් හෙවත් ස්වභාව ධර්මය සංයෝගයේ බල මහිමයෙන්ම එලෙස ඒ සැම සිදුව ඇති බව දැනගැනීම යහපති."

ඉහත සඳහන් වූයේ පේරාදෙණියේ සඳසිරියේ වැසි පුරාවෘත විශේෂඥ සී. පී. කුලතිලක මහතා විසින් 1952 දෙසැම්බර් මස 27 වැනි දින ගෝවේ මෘත දේහය කාගේද යන මැයෙන් ආරම්භ කරන ලද ලිපි පෙළක අවසාන කොටසයි. මෙම ලිපිවල සඳහන් කොටස් ඔහුගේම වචනවලින් උපුටා දක්වන්නට සිතුවේ මීට දශක කිහිපයකට පෙර මේ සම්බන්ධයෙන් දැක්වූ උනන්දුව සහ භාවිත කරන ලද වචනවල ස්වරූපය, එම ශෛලියද පෙන්වනු පිණිසය. ඔහු විසින් උත්සාහ කර ඇත්තේ කතෝලික බැතිමතුන්ගේ ආගමික සාස්තෘවරයාට හෝ මැවුම්කාර දෙවියන් වහන්සේට හෝ අපහාස කිරීමට නොව මෙම දේහය දෙවියන් විසින් සුරක්ෂිත කරන ලද එකකැයි යම් කෙනෙක් කියන්නේ නම් ඔවුන් විසින්ම එම දෙවියන්ගේ බල මහිමය හෑල්ලුවට පත් කරන බැවින් එසේ කිරීමෙන් වළකින ලෙස කියාපෑමටය. දේහය දැන් දිරාපත් වෙමින් පවතින බැවින් බුද්ධ දර්ශනයෙහි සඳහන් වන සියලු දේ අනිත්‍යයි යන්න මෙයටත් බලපා ඇති බවත් දෙවියන් විසින් සුරක්ෂිත කොට ඇත්නම් එය සදාකාලික එකක් වනු ඇති බවත්ය. එය සදාකාලිකව සුරක්ෂිත වී නොමැති නිසා එම දේහය දෙවියන් වහන්සේ විසින් ආරක්‍ෂා කළ එකක් හෝ දේව බැල්මක් නොලද එකක් බවය. එසේ නම් එය සාන්ත සේවියර් පියතුමාගේ දේහය වීමට නොහැක. එය නම් බෙහෙත් බලයෙන් වසර ගණනාවක් නරක් නොවී තබාගත් රාහුල හිමියන්ගේම දේහය බවයි.

**සැකසුම: මදූක ජයලත්**
**අනුවාදනය: 1.0**
**දිනය: 2016 ඔක්තෝම්බර් 21**